රාජ්‍ය දැව සංස්ථාව



# වාර්ෂික වාර්තාව 2014

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

# වාර්ෂික වාර්තාව
# 2014

රාජ්‍ය දැව සංස්ථාව



# අපේ හෙට දින

## දැක්ම

ජාතියේ
විශ්වාසනීයත්වය දිනූ
අනර්ඝතම දැව
හා දැවමය
භාණ්ඩ සැපයුම්කරුවීම
සහ
දැව වෙළෙඳ පොළෙහි
සැබෑ නායකත්වය ඉසිලීම.

## මෙහෙවර

අප සතු තාක්ෂණික දැනුම,
කීර්තිනාමය හා නිපුනතාවය
උපයෝගී කරගනිමින්
නීත්‍යානුකූලව,
පරිසර හිතකාමී අන්දමින්
ජාතික අවශ්‍යතාවය අනුව
අපගේ ගැනුම්කරුවන්ගේ
දැව සහ දැවමය භාණ්ඩ ඉල්ලීම
නිෂ්පාදනය කර ලබාදීම.

රචනය හා සැකැස්ම : දුලිනි විජේසූරිය
යතුරු ලේඛනය : නිරෝෂා වර්ණකුලසූරිය
නිර්මාණය / මුද්‍රණය : ප්‍රින්ටෙක් එක්ස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම / 011 2 815 816




අපි
රාජ්‍ය දැව සංස්ථාව

බාධක ජයගනිමින්
නැඟීසිටින
හැම මොහොතකම,
අවංක කැපවීම හා
නව්‍යකරණය තුළින්

සාර්ථකත්වය කරා
පියනගමු.

# පටුන


| | |
|---|---|
| ආරම්භය සහ අද අපි | 06-07 |
| සම්මාන හා ගෞරව | 08 |
| මූල්‍ය ප්‍රකාශන උද්ධෘත | 09 |
| ආයතනික තොරතුරු | 10 |
| කළමනාකරණ මඬුල්ල | 11-13 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 14-15 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය | 16-17 |
| අපගේ කාර්යභාරයන් | 18 |
| අපගේ ව්‍යාපාරික වටිනාකම් | 19 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 20-21 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මඬුල්ල | 22-23 |
| 2014 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය | 24-33 |
| විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව | 34 |
| මූල්‍ය හා නිෂ්පාදන කාර්යසාධනය | 35-38 |
| දශකයක තොරතුරු | 39 |
| ජාතික ආර්ථිකයට රාජ්‍ය දැව සංස්ථාවේ දායකත්වය | 40-43 |
| සංස්ථාපිත පාලනය | 44-51 |
| තිරසර අනාගතයක් වෙනුවෙන් | 52-61 |
| විගණකාධිපති වාර්තාව | 62-78 |
| වාර්ෂික ගිණුම් | 79-101 |
| පාරිභාෂික ශබ්ද මාලාව | 102 |






## ආරම්භය

රාජ්‍ය දැව සංස්ථාව රජය සතු ව්‍යාපාරයකි. එය 1968 වර්ෂයේ දී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර, 1982 පෙබරවාරි 05 දිනැති අංකඃ178/10 අති විශේෂ ගැසට් නිවේදනය සහ 2009 වර්ෂයේ ජුනි 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී. යෙදවූ මූලික ප්‍රාග්ධනය රු.මිලියන 2.5කි.

## අද අපි

ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල''සම්පත්පාය'' පරිශ්‍රයෙහි පිහිටුවා ඇති අතර, ප්‍රාදේශීය ඒකක උප කාර්යාල දීප ව්‍යාප්තව ස්ථානගත කර ඇත. රාජ්‍ය දැව සංස්ථාවේ මූලික ආදායම් ප්‍රභවය දැව හා දැවමය නිෂ්පාදන අලෙවිය වන අතර, තිරසාර අස්වැන්නක් උදෙසා රාජ්‍ය දැව සංස්ථාව, වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව තිරසාර වනාන්තර වැඩසටහන් ක්‍රමය ක්‍රියාවට නංවනු ලබයි.


ඉතා උසස් තත්වයේ දැව නිෂ්පාදන හා විශිෂ්ඨ සේවාවක් සැපයීමට අප නිරතුරු උත්සුක වන අතර ඉකුත් වසර 46 ක් මුළුල්ලේ රාජ්‍ය දැව සංස්ථාව දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ උච්චස්ථානයේ වැජඹීමට මෙය හේතු සාධක වූ අතර, ඉහළ ශ්‍රේණියේ නිෂ්පාදන ඇගයීමේදී අපගේ නිෂ්පාදන පිළිගත් සාධනීය සලකුණක් ලෙස භාවිතයට පත්ව ඇත.





# මූල්‍ය ප්‍රකාශන උද්ධෘත


**2014 මූල්‍ය වර්ෂය තුළදී රාජ්‍ය දැව සංස්ථාව සැලකිය යුතු කාර්යසාධනයක් වාර්තා කර ඇත. ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක පහත පරිදි වේ.**


| දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා | | 2014 | 2013 | වෙනස% |
|---|---|---|---|---|
| **ඉපැයීම් සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත** | | | | |
| අයභාරය | රු .000 | 3,473,847 | 2,893,749 | 20% |
| භාණ්ඩාගාර හා ආදායම් බදු වලට පෙර ලාභය | රු .000 | 427,222 | 382,337 | 12% |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | රු .000 | 25,000 | 50,000 | -50% |
| ආදායම් බදු | රු .000 | 196,225 | 150,223 | 31% |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | රු .000 | 205,998 | 182,114 | 13% |
| ස්කන්ධය මත ඉපැයීම් | % | 11.92 | 11.32 | 5% |
| වත්කම් මත ඉපැයීම් | % | 7.55 | 7.94 | -5% |
| **ශේෂ පත්‍ර සම්බන්ධ ප්‍රධාන දත්ත සහ අනුපාත** | | | | |
| මුළු වත්කම් | රු .000 | 5,659,768 | 4,812,312 | 18% |
| මුළු ස්කන්ධය | රු .000 | 3,583,129 | 3,377,223 | 6% |
| මුළු ණයහිමියන් | රු .000 | 2,076,640 | 1,435,089 | 45% |
| ණය/ස්කන්ධ | % | 57.96 | 42.49 | 36% |
| ණය/මුළු වත්කම් | % | 36.69 | 29.82 | 23% |
| **වෙනත් තොරතුරු** | | | | |
| මුළු සේවකයන් | සංඛ්‍යාව | 2,186 | 2,139 | 2% |
| එක් සේවකයෙකුට අයභාරය | රු .000 | 1,589 | 1,353 | 17% |
| එක් සේවකයෙකුට ලාභය (භාණ්ඩාගාර හා ආදායම් බදු වලට පෙර) | රු .000 | 195 | 179 | 9% |



| | |
|---|---|
| ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා | - පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා |
| ගරු අල්හාජ් ඒ.ආර්.එම්.අබ්දුල් කාදර් මහතා | - පරිසර හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා |
| ආචාර්ය බී.එම්.යූ.ඩී.බස්නායක මහතා | - ලේකම් - පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශය |

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| එස්.අමරසිංහ මහතා | - සභාපති, රාජ්‍ය දැව සංස්ථාව |
| කෝසල හෙට්ටිආරච්චි මහතා | - ක්‍රියාකාරි අධ්‍යක්ෂක, රාජ්‍ය දැව සංස්ථාව |
| ඒ.කේ.ඒ.වයි.තරංග මහතා | - අධ්‍යක්ෂක (භාණ්ඩාගාර නියෝජිත) |
| එස්.ඒ.ඒ.සතුරුසිංහ මහතා | - අධ්‍යක්ෂක (වනසංරක්ෂක ජෙනරාල්) |
| ඩබ්.එම්.විජේරත්න මහතා | - අධ්‍යක්ෂක |
| මහාචාර්ය හිරාන් එස්. අමරසේකර මහතා | - අධ්‍යක්ෂක |
| මේරි ඩික්මන් මහත්මිය | - අධ්‍යක්ෂක |
| පී.පී.කුමාරසිංහ සිරිසේන මහතා | - සාමාන්‍යාධිකාරි, රාජ්‍ය දැව සංස්ථාව |

## විගණන හා කළමනාකරණ කමිටුව

| | |
|---|---|
| ඒ.කේ.ඒ.වයි.තරංග මහතා | - කමිටු සභාපති |
| එස්.ඒ.ඒ.සතුරුසිංහ මහතා | - කමිටු සාමාජික |
| මහාචාර්ය හිරාන් එස්. අමරසේකර මහතා | - කමිටු සාමාජික |

## විගණක

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

## ප්‍රධාන කාර්යාලය (ලියාපදිංචි ලිපිනය)

82, ''සම්පත්පාය'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
ශ්‍රී ලංකා.

## ප්‍රධාන බැංකුව

ලංකා බැංකුව

## මුදල් වර්ෂය

ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා

දුරකථන : -94112866600-5
ෆැක්ස් : -94112866623
වෙබ් අඩවිය : www.timco.lk





| | | |
|---|---|---|
| සාමාන්‍යාධිකාරි | : පී.පී.කුමාරසිංහ සිරිසේන | Bsc. Mgt (SP), Master of Management (HRM), Master of Business Administration, Post Graduate (A&FM), DIP. BUSINESS MANAGEMENT, APFA (ICA), MIOGAF, FMAAT |

**නි.සාමාන්‍යාධිකාරි**

| | | |
|---|---|---|
| මානව සම්පත් හා පරිපාලන | : කේ.සිරිනිවංශ | Bsc., Msc. (Forestry), Dip.(Bus. mgt), Post Grad. Dip. (Forest survey-Netherland), Dip(Forest products research-Japan) |
| නි.සාමාන්‍යාධිකාරි - මෙහෙයුම් | : එච්.පී.එස්.නවරත්න | Bsc., Msc. (Forestry), Pg Dip in forestry for Rural Mgt. (Netherland) |
| නි.සාමාන්‍යාධිකාරි - අලෙවි | : පී.සේනානායක | BA. (Econ. /Stat.) Spld - Wood Industry- CSR – REMINI in Italy |
| නි.සාමාන්‍යාධිකාරි - තොරතුරු තාක්ෂණ | : ඩී.යූ.දයාරත්න | Bsc. Msc.(Com. Sc) |
| නි.සාමාන්‍යාධිකාරි - පර්යේෂණ, පුහුණු හා සංවර්ධන | : ආචාර්ය එන්. රුවන්පතිරණ | Bsc. Msc. PhD. (Forestry) |
| නි.සාමාන්‍යාධිකාරි - නිෂ්පාදන හා තාක්ෂණ | : එච්.එම්.පී.බී.හේරත් | NDT (Mech.) ,ECGI(UK),MIIESL, Post Grad.Dip. (Mech. Wood Tech. & Prod. Mgt. -Finland) |
| නි.සාමාන්‍යාධිකාරි - අභ්‍යන්තර විගණක | : ඩබ්.ඩබ්.එම්.ජේ.කුරේ | FCA |
| නි.සාමාන්‍යාධිකාරි - මුදල් | : පී.ඩී.එස්.කුමාරසිංහ | Bsc. (Acct. Fin. Mgt.), MBA, ACA, ACMA |

**සහකාර සාමාන්‍යාධිකාරීන්**

| | | |
|---|---|---|
| ස.සාමාන්‍යාධිකාරි - කලාප 1 | : එස්.එස්.පඬුවාවල | Bsc.,Msc. (Forestry), Post Grad. Dip.(Forest survey- Netherland), Post Grad. Dip. (Mech.Wood Tech. & Prod. Mgt. - Finland) |
| ස.සාමාන්‍යාධිකාරි - යාන්ත්‍රික ඉංජිනේරු | : ඩී.එස්.සමරකෝන් | MIE (SL), C. Eng, NDT (Mec) |
| ස.සාමාන්‍යාධිකාරි - නිෂ්පාදන | : ටී.එස්.සී.පුෂ්පකුමාර | Bsc.Post Grad.Dip. (Mech.Wood Tech. & Prod.Mgt) in Finland |
| ස.සාමාන්‍යාධිකාරි - කලාප 111 | : පී.පී.ආර්.සමරවීර | Bsc. Msc. (Forestry) |

**කළමනාකරුවන්**

| | | |
|---|---|---|
| කළමනාකාර - දැව සැපයුම් | : එම්.සී.දේවේන්ද්‍ර | Bsc., Msc (Forestry) |
| කළමනාකාර - මුදල් | : ඩී.වික්‍රමසිංහ | Dip. (FA) |

| | | |
|---|---|---|
| කළමනාකාර - මුදල් | : ආර්.එම්.රත්නපාල | H.N.D.A., Post Grad. Dip. in Finance (India)-1st Class, Member A.A.T., Member U.K.A.P. |
| කළමනාකාර - මුදල් | : එච්.ඒ.ජේ.එම්.පීරිස් | ICASL (L), Higher Dip. (Accountancy) |
| කළමනාකාර - නීති හා පාලන | : ඒ.ජී.එච්.කුලරත්න | Dip in English, Dip in Forestry, Dip in Mgt., PgD LRHRM, ACPM |
| කළමනාකාර - මානව සම්පත් | : ඊ.ඒ.ඩී.එස්.ඒ. අමරසිංහ | |
| කළමනාකාර - නිෂ්පාදන | : ආචාර්යී එම්.ජී. මොහමඩ් තාරික් | Bsc, Msc, Phd. |
| කළමනාකාර - මිලදීගැනීම් හා නාවික | : අරුණ ද සිල්වා | |
| කළමනාකාර - පර්යේෂණ, පුහුණු හා සංවර්ධන | : සී.කේ.මුතුමාල | Bsc (Agric.)Hons. Msc (Forestry) |
| කළමනාකාර - විමර්ශණ | : ඊ.ජී.තිලකරත්න | |
| කළමනාකාර - ඉරුම්හල් | : ඩබ්.බී.සමන්ත | Bsc. (Gen), Msc. (Forestry), National Dip in Teaching |
| කළමනාකාර - නැවත වනවගා | : ඒ.පී.රත්නසූරිය | |
| කළමනාකාර - විශේෂ ව්‍යාපෘති | : ඒ.එන්.ඩබ්.ඒ.ආනන්ද | |
| කළමනාකාර - ගෘහභාණ්ඩ යන්ත්‍රාගාරය | : එම්.කේ.ඩබ්. දිසානායක | B.com, Post Grad. Dip in International Affairs |
| | : ජේ.පී.තිසර ගමගේ | Bsc. |
| කළමනාකාර - තොරතුරු තාක්ෂණ | : ඒ.ජී.මාදුවගේ | |
| කළමනාකාර - දැව ශ්‍රේණි කිරීම් | : වයි.බී.එම්.අමීර් | Dip in Forestry |
| කළමනාකාර - වන අපරාධ | : ඩබ්.අයි.සාරංග | Bsc (Hons) |

**ප්‍රාදේශීය කළමනාකරුවන්**

| | | |
|---|---|---|
| ප්‍රා.ක. - මින්නේරිය | : ආර්.එදිරිසිංහ | |
| ප්‍රා.ක. - බණ්ඩාරවෙල | : පී.කේ.අජිත් චන්දන | Bsc. |
| ප්‍රා.ක. - කොළඹ | : ඩබ්.කීර්ති රෝයි | |
| ප්‍රා.ක. - අනුරාධපුර | : යූ.එස්.එම්.ප්‍රනාන්දු | BA (Sp.) |
| ප්‍රා.ක. - රත්නපුර | : එච්.බී.රජවත්ත | BA |
| ප්‍රා.ක. - නුවරඑළිය | : පී.ගුණවංශ | BA (Sp.), Dip in Forestry |
| ප්‍රා.ක. - මොණරාගල | : යූ.පී.එච්.උළුවඩුගේ | Bsc. |
| ප්‍රා.ක. - නුවර | : ඊ.එම්.එස්.ඒකනායක | |
| ප්‍රා.ක. - යාපනය | : එස්.ශ්‍රී ස්කන්දරාජා | |
| ප්‍රා.ක. - කුරුණෑගල | : ඒ.එස්.විජේසුන්දර | |
| ප්‍රා.ක. - මාතර | : ඩී.එච්.රාජපක්ෂ | Bsc., Msc. |
| ප්‍රා.ක. - අම්පාර | : එම්.කේ.පී.වසන්ත රාජ් | |



**සංකීර්ණ භාර කළමනාකරුවන්**

| | | |
|---|---|---|
| කළමනාකාර - සිල්පර හා විදුලිකණු කල්දෙමුල්ල | : ඩී.එම්.නිල්මිණි පුෂ්පකුමාර | Bsc. |
| ප්‍රා.කළමනාකාර - කැප්පෙටිපොල | : ඒ.බී.එම්.වීරසිංහ | BA |

**නියෝජ්‍ය කළමනාකරුවන්**

| | | |
|---|---|---|
| නි.ප්‍රධාන අභ්‍යන්තර විගණක | : එච්.එම්.එස්.මාධව | B.com (Sp) |
| නි.කළමනාකාර - දැව | | |
| ශ්‍රේණි කිරීම්/වෙන්දේසි | : ටී.එච්.ගුණදාස | |
| නි.කළමනාකාර - ආරක්ෂක | : චන්දිම වීරමන් | |
| නි.කළමනාකාර - නිර්මාණ හා තත්වපාලන | : ඊ.එම්.එම්.ප්‍රනාන්දු | |
| පද්ධති විශ්ලේෂක | : ඩබ්.එච්.ඒ.චන්ද්‍රකුමාර<br>: ජේ.එම්.එම්.බී.ජයසුන්දර | Bsc |

**නියෝජ්‍ය ප්‍රාදේශීය කළමනාකරුවන්**

| | | |
|---|---|---|
| නි.ප්‍රා.කළමනාකාර - අනුරාධපුර | : කේ.පී.සී.රත්නසේකර | BA |
| නි.ප්‍රා.කළමනාකාර - කොළඹ | : එච්.පී.එස්.දිසානායක | BA |
| නි.ප්‍රා.කළමනාකාර - බණ්ඩාරවෙල | : යූ.වී.කිත්සිරි | Dip in Forestry |
| නි.ප්‍රා.කළමනාකාර - මාතර | : ආර්.විජේතුංග | Bsc. (Agri. Sp.), |
| | : එල්.එස්.ජයසේකර | |
| නි.ප්‍රා.කළමනාකාර - | | |
| අම්පාර ගෘ.කර්මාන්තශාලාව | : ඒ.සී.ජිනේජුදීන් | |
| නි.ප්‍රා.කළමනාකාර - නුවර | : ඩී.පී.සිරිල්<br>: ආර්.සී.සමන් කුමාර | |
| නි.ප්‍රා.කළමනාකාර - මොණරාගල | : දුමින්ද නවරත්න | |
| නි.ප්‍රා.කළමනාකාර - කුරුණෑගල | : ආර්.එම්.එස්.කේ.රත්නායක<br>: සුනිල් විජිත බණ්ඩාර | |
| නි.ප්‍රා.කළමනාකාර - රත්නපුර | : එච්.එල්.නන්දන<br>: එච්.ඒ.ගාමිණි අල්විස් | |
| නි.ප්‍රා.කළමනාකාර - යාපනය | : ටී.පී.රමීෂ් | |
| නි.ප්‍රා.කළමනාකාර - මාතලේ | : ඩී.එල්.අබේනායක | |
| නි.ප්‍රා.කළමනාකාර - කල්දෙමුල්ල | : එන්.පී.නිහාල්<br>: ටී.එස්.රූපසිංහ | |
| නි.ප්‍රා.කළමනාකාර - මින්නේරිය | : එස්.සී.ජයමාන්න | |
| නි.ප්‍රා.කළමනාකාර - අම්පාර | : එම්.ඩී. චමිල සම්පත් | |
| නි.ප්‍රා.කළමනාකාර - නුවර එළිය | : ඩී.ඒ. හෙන්දාවිතාරණ<br>: එම්.ඩබ්.යූ.ජේ. පියනන්දන | |



*''අනාගත පුනර්ජීවය උදෙසා වගකීමෙන් සහ ස්ථාවරත්වයෙන් ද, නිර්මාණශීලී නවෝත්පාදනයන් ද සමඟින් ආයෝජනය කිරීමට අප උත්සුක වන්නෙමු. තවද, වගකිවයුතු පුරවැසියෙකු ලෙස රුක් රෝපණය තවදුරටත් ප්‍රචලිත කොට ශක්තිමත් කිරීම උදෙසා හඳුනාගත් පාසල් සඳහා ද්‍රව්‍යමය හා මුදල්මය ආධාර ලබාදෙමින් ද, දේශන, සංවිධානය කරමින් ද, කළුවර වැනි වටිනා ශාක පාසැල් අතරේ බෙදා දෙමින් ද තරුණ පරපුරේ ශාක වගාකිරීම සම්බන්ධ ඇල්ම වැඩි කිරීමේ අරමුණින් ''තුරුජන සිසු බැංකු'' රුක්රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.''*

# සභාපතිතුමාගේ සමාලෝචනය



රාජ්‍ය දැව සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනුයේ හදපිරි සතුටිනි.

2013 වර්ෂයේ 7.2% ක මූර්ත දළ දේශීය නිෂ්පාදිත වර්ධනයට සාපේක්ෂව 2014 වර්ෂයේ 7.4% ක මූර්ත දළ දේශීය නිෂ්පාදිත වර්ධනයක් ළඟාකර ගැනීමට ජාතික ආර්ථිකය සමත් වී ඇත. දේශීය ආර්ථික සංවර්ධනය වෙනුවෙන් සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් රටේ තිරසාර ආර්ථික වර්ධනය සඳහා දායක වී ඇති බව මනාව පැහැදිළි වේ. දළ දේශීය නිෂ්පාදිතයෙන් 57.6% ක් නියෝජනය කරන සේවා අංශය 2013 වර්ෂයේ 6.4% ක වර්ධනයට සාපේක්ෂව 2014 වර්ෂයේ 6.5% කින් වර්ධනය වී ඇති අතර, දළ දේශීය නිෂ්පාදිතයෙන් 32.3% ක් නියෝජනය කරන කාර්මික අංශය පසුගිය වර්ෂයේ 9.9% ට සාපේක්ෂව 11.4% ක වර්ධනයක් 2014 වර්ෂයේ පෙන්නුම් කරන ලදී. පසුගිය වර්ෂයේ 4.7% ට සාපේක්ෂව, කෘෂිකාර්මික අංශය පෙන්නුම් කරනුයේ 0.3% ක වර්ධනයකි.

රාජ්‍ය දැව සංස්ථාවේ කාර්ය සාධනයට ප්‍රබලව බලපාන සාධක අතර වන කළමනාකරණය පිළිබඳ ආර්ථික, සාමාජයීය, දේශපාලනික සහ ජීව විද්‍යාත්මක පසුබිම තේරුම් ගැනීමත්, එම අංශ සමබර කරගැනීමත් අවදානම් සහිත සහ අභියෝගාත්මක සංසිද්ධියකි. වන විනාශය අද පවත්නා දැවැන්ත පාරිසරික අර්බුදයකි. දැව හා දැවමය භාණ්ඩ සඳහා ඇති ඉහළ ඉල්ලුම හේතුවෙන් නීත්‍යානුකූල නොවන අයුරින් වන විනාශය සිදුකිරීමට පෙළඹී ඇති වකවානුවක නියමාකාරයේ වන කළමනාකරණයක් තුළින් පමණක් වන සම්පත අනාගත පරපුරේ පරිභෝජනය සඳහා රැකගත හැකිවේ. තිරසාර දැව අස්වනු නෙලීම වන විනාශයට හේතු නොවේ.එනම්, දැව අස්වනු නෙලීමේදී වනවගා භූමියේ නිෂ්පාදන හැකියාව ආරක්ෂා වන පරිදි ඉතා ක්‍රමවත්ව හා විද්‍යානුකූලව කටයුතු කිරීමෙන් සහ වයස්ගත ශාක වෙනුවට නව ශාක රෝපණය කොට, නව වනවගා ඇති කිරීමට කටයුතු කිරීම තුළින් පමණක් සමාජයට දිගුකාලීන ප්‍රතිලාභ සලසාගත හැකිවේ. කෙසේ නමුත් ශාක යනු සදහටම පවතින ජීවයක් නොවේ. කිසියම් මොහොතක පරිණත ශාක දිරාපත්ව ගොස් ඒ වෙනුවට වේගයෙන් වැඩෙන ළදරු ශාක එම භූමිය ආක්‍රමණය කිරීම තුළින් ස්වභාවිකවම පරිණත ශාක මියගොස් ඒ වෙනුවට නව ශාක ප්‍රතිස්ථාපනය



සිදුවේ.මෙවැනි පසුබිමක් තුල අප සංස්ථාව රු.මිලියන 3,474 ක ආදායමක් වාර්තා කළ අතර, පසුගිය වසරේ එම අගය රුපියල් මිලියන 2,894 කි. නව අලෙවි සහ නිෂ්පාදන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම මෙම වර්ධනයට ප්‍රබලව බලපාන ලදී. රුපියල් මිලියන 124 ක පසුගිය වර්ෂයෙහි මෙහෙයුම් ලාභයට සාපේක්ෂව රුපියල් මිලියන 204 ක මෙහෙයුම් ලාභයක් මෙම වසරේ උපයා ඇත. ආදායම් බදු හා විශේෂ බදු පෙර ශුද්ධ ලාභය මෙම වසරේ රුපියල් මිලියන 427 ක් වූ අතර, පසුගිය වසරේ එය රු.මිලියන 382 ක් ලෙස වාර්තා වී ඇත. රුපියල් මිලියන 182 ක පසුගිය වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභයට සාපේක්ෂව රුපියල් මිලියන 206 ක බදු පසු ශුද්ධ ලාභයක් මෙම වසරේ උපයා ඇත. රු.මිලියන 1,396 ක ස්කන්ධභාග, මෙහෙයුම් බදු සහ භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයා ඇත. සංස්ථාව සතු වටිනාම සම්පත වන්නේ මානව සම්පත බව අපගේ විශ්වාසයයි. 2014 කාලපරිච්ඡේදය තුලදී පෙර වර්ෂ මෙන්ම අප සංස්ථාව විසින් මානව සම්පත පුහුණු හා වෘත්තිය සංවර්ධන වැඩසටහන් තුලින් කුසලතා හා දක්ෂතා වැඩිදියුණු කොට පාරිභෝගිකයන්ට වඩා කාර්යක්ෂම සහ උපරිම සේවයක් සැපයීම මෙන්ම ආයතනයේ ඉලක්ක මුදුන් පමුණුවා ගැනීමේ අරමුණින් කටයුතු කරන ලදී.

රාජ්‍ය දැව සංස්ථාව හැමවිටම උත්සාහ දරනුයේ සංස්ථාවේ සියලුම අංශ තුල යහපත් පාලනයක් සමඟ වඩා හොඳ ක්‍රියාපිළිවෙලකට අනුව කටයුතු කිරීම සඳහා ය. අපගේ සාර්ථකත්වයට සාක්ෂි සපයනු වස් ''දැව ජවයේ නායකත්වය'' යන තේමාව ශක්තිමත් කරමින් රාජ්‍ය දැව සංස්ථාව මෙම වසරේදී ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන උළෙලේදී යළිත් වරක් රිදී සම්මානයකින් පිදුම් ලැබීය. අනාගත පුනර්ජීවය උදෙසා වගකීමෙන් සහ ස්ථාවරත්වයෙන් ද, නිර්මාණශීලී නවෝත්පාදනයන් ද සමඟින් ආයෝජනය කිරීමට අප උත්සුක වන්නෙමු. තවද, වගකිවයුතු පුරවැසියෙකු ලෙස රුක් රෝපණය තවදුරටත් ප්‍රචලිත කොට ශක්තිමත් කිරීම උදෙසා හඳුනාගත් පාසල් සඳහා ද්‍රව්‍යමය හා මුදල්මය ආධාර ලබාදෙමින් ද, දේශන, සංවිධානය කරමින් ද, කළුවර වැනි වටිනා ශාක පාසැල් අතරේ බෙදා දෙමින් ද තරුණ පරපුරේ ශාක වගාකිරීම සම්බන්ධ ඇල්ම වැඩි කිරීමේ අරමුණින් ''තුරුජන සිසු බැංකු'' රුක්රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. තවද ''දැයට සෙවණ'' ජාතික රුක් රෝපණ වැඩසටහන වෙනුවෙන් කුඩා පැළ 88,000ක් බෙදාදෙන ලදී. දැව හා දැවමය නිෂ්පාදන සඳහා වූ අනාගත ඉල්ලුම සපුරාලීම සඳහා අප සංස්ථාව දැනටමත් ආර්ථික ප්‍රතිලාභ අරමුණු කොට ගෙන වන රෝපණ වැඩසටහන් ආරම්භ කර ඇත. තවද, එදිනෙදා කසල බැහැර කිරීමේ දී ඒවා කඩදාසි, පොලිතින්, කාබනික ද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කොට අපහරණය කිරීමට කටයුතු යොදා ඇත. සමාජය අතර දැව භාවිතය සම්බන්ධව පවතින දුර්මත දුරලීමේ අරමුණු පෙරදැරිව ''දැයට කිරුළ -කුලියාපිටිය'', ප්‍රදර්ශණය සඳහා ක්‍රියාකාරීව සම්බන්ධවීමු.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ගරු පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාටත්, අමාත්‍යංශ ලේකම්තුමා හා එම කාර්ය මණ්ඩලයටත්, වන සංරක්ෂක ජෙනරාල්තුමා ඇතුළු එම දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලුම කාර්යය මණ්ඩලයටත්, අනෙකුත් සියලුම රජයේ නිලධාරීන්ටත් අපහට ලබා දුන් සහයෝගය වෙනුවෙන් කෘතවේදීත්වය පුදකරමි. විවිධ දුෂ්කරතා සහ අභියෝග හමුවේ අපගේ සාමාන්‍යාධිකාරිතුමා ඇතළු සේවක මණ්ඩලය ඔවුන්ගේ ශක්තීන් හා උපාය කෞශල්‍යයන් අඛණ්ඩව කැපකරමින්, සංස්ථාවේ කාර්ය සාධනය ඉහළ තලයකට නංවාලීමට ගත් ප්‍රසංශනීය කාර්යභාරය වෙනුවෙන් අපගේ විශේෂ ස්තූතිය ඔවුන් වෙතද පුදකර සිටිමු.

2015 නව වර්ෂය ඉතා පහසු වසරක් ලෙස අපේක්ෂා නොකරනමුත්, කෙටිකාලීන අභියෝග මෙන්ම දිගුකාලීන අභියෝග කරා යොමුවෙමින්, අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීම උදෙසා අපගේ හැකියාවන් උපරිමයෙන් කැපකරමින් විශිෂ්ඨ ප්‍රතිඵල අත්කරදීම පිණිස ඇපකැප වී සිටින්නෙමු.

**එස්.අමරසිංහ,**
සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව.



# සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය

රාජ්‍ය දැව සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳ මා ඉතාමත් සතුටට පත්වෙමි.

රාජ්‍ය දැව සංස්ථාව ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සපයමින් දැව වෙළෙඳපොළේ සැබෑ නායකත්වය උසුලයි. දිවයින පුරා පැතිර ගිය ප්‍රාදේශීය කාර්යාල 12ක්, අලෙවි මධ්‍යස්ථාන 54ක්, 200කට අධික දැව හෙළීම් සිදුකරන ක්‍රියාකාරී වැඩබිම් සහ දැව පදම් කිරීමේ හා පරිරක්ෂණය කිරීමේ යන්ත්‍රාගාර වලින් සමන්විත ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර 03ක් හා ප්‍රදර්ශණාගාර 06ක් රාජ්‍ය දැව සංස්ථාව සතුව පවතී.

2014 වර්ෂාවසානයේ ශ්‍රී ලංකාව 7.4%ක හිතකර දළ දේශීය නිෂ්පාදිත වර්ධනයක් ළඟාකරගත් අතර, එම වර්ෂය රාජ්‍ය දැව සංස්ථාවට සුවිශේෂී වර්ෂයකි. ශ්‍රී ලාංකීය රජය දිගුකාලීනව තිරසාර ආර්ථික වර්ධනයක් මුදුන් පත්කරගැනීම අරමුණින් දිවයින පුරා ආර්ථික හා සාමාජීය යටිතල පහසුකම් දියුණු කිරීමට මහත් වෑයමක් දරයි. ව්‍යාපාරික දෘෂ්ඨි කෝණයෙන් බලන කළ රාජ්‍ය දැව සංස්ථාවේ පිරිවැටුම වැඩිකිරීම සඳහා අප විසින් පවත්නා අවස්ථාවලට ගැලපෙන පරිදි මෙහෙයුම් කටයුතු වල වෙනස්කම් කිහිපයක් සිදුකරන ලදී. අන්තර්ජාතික වෙළෙඳපොළ පවතින අවස්ථා පිළිබඳවද අවධානයෙන් පසුවෙමින් දැව සංස්ථාවේ ආදායම් ඉහළ නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේවන විටත් ගෙන ඇත. 2014 වර්ෂයේ තිරසාර හා ලාභදායි ව්‍යාපාරයක් ලෙස සාර්ථකත්වයක් අත්පත් කර ගැනීමට දිවයින පුරා ශාඛා ව්‍යාප්තියත්, ඇල්මැති පාර්ශවයන් අතර ප්‍රබල සහයෝගීතාවයකින් කටයුතු කිරීමත් භාණ්ඩ විවිධාංගීකරණය සහ නවීන තාක්ෂණය පිටුවහල් වූ බව කිව යුතුය.

මෙම වර්ෂයේ අප සංස්ථාව රු.මිලියන 427 ක බදු පෙර ශුද්ධ ලාභයක් ලබාගත් අතර, පසුගිය වසරේ එම අගය රු.මිලියන 382 ක් වූ අතර, එය ඉකුත් වසරට සාපේක්ෂව 12% ක වර්ධනයකි. රාජ්‍ය දැව සංස්ථාව රු.මිලියන 2,894 ක පසුගිය වර්ෂයේ විකුණුම් ආදායමට සාපේක්ෂව රු.මිලියන 3,474ක විකුණුම් ආදායමක් මෙම වසරේ උපයා ඇත. එය ඉකුත් වසරට සාපේක්ෂව 20% ක වර්ධනයකි. රාජ්‍ය දැව සංස්ථාව රු.මිලියන 206 බදු පසු ශුද්ධ ලාභයක් උපයා ඇති අතර, එය ජාතික ආර්ථිකයට රු.මිලියන 1,396 ක දායකත්වයක් සපයයි.

අපගේ ඉහළ නිෂ්පාදන ප්‍රමිතීන් තවදුරටත් තහවුරු කරමින් 2014 මූල්‍ය වර්ෂය තුළදී අප ළඟාකරගත් සුවිශේෂී ජයග්‍රහණය පිළිබඳව සනිටුහන් කරනුයේ අතිශය ආඩම්බරයෙනි. රටේ ආර්ථික දියුණුවට දායකත්වය සපයමින්, විශිෂ්ඨ අයුරින් ව්‍යාපාර කටයුතු මෙහෙයවන ව්‍යාපාරික ආයතන හඳුනාගැනීම පිණිස ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය මගින් පවත්වන ලද 2014 ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන උළලේදී, රාජ්‍ය නිෂ්පාදන අංශයට හිමි රිදී සම්මානයෙන් පිදුම් ලැබීය. තවදුරටත් අපගේ රඳාපැවැත්ම උදෙසාම නොව, අපගේ ඉදිරි පරපුර වෙනුවෙන් පරිසරය පිළිබඳ සැලකිලිමත්වීමේ හා වගකීමේ අවශ්‍යතාවය හඳුනාගනිමින් ''දැයට සෙවණ'' ජාතික රුක් රෝපණ වැඩසටහන යටතේ සංස්ථාව සතු තවාන්වල සාදන ලද පැල 88,000 ක් බෙදා දෙන ලදී. එමෙන්ම තරුණ ප්‍රජාව අතර රුක් රෝපණය පිළිබඳ ඇල්ම වැඩිකිරීමේ අරමුණින් ලෝක පරිසර දිනයට සමගාමීව ''තුරු ජන සිසු බැංකු'' රුක් රෝපණ වැඩ සටහන ඵලදායී ලෙස අඛණ්ඩව මේ වසරේදීත් ක්‍රියාත්මක කරන ලදී.






''අපගේ ඉහළ නිෂ්පාදන ප්‍රමිතීන් තවදුරටත් තහවුරු කරමින් 2014 මූල්‍ය වර්ෂය තුළදී අප ළඟාකරගත් සුවිශේෂී ජයග්‍රහණය පිළිබඳව සනිටුහන් කරනුයේ අතිශය ආඩම්බරයෙනි. රටේ ආර්ථික දියුණුවට දායකත්වය සපයමින්, විශිෂ්ඨ අයුරින් ව්‍යාපාර කටයුතු මෙහෙයවන ව්‍යාපාරික ආයතන හඳුනාගැනීම පිණිස ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය මගින් පවත්වන ලද 2014 ජාතික ව්‍යාපාර විශිෂ්ඨතා සම්මාන උළලේදී, රාජ්‍ය නිෂ්පාදන අංශයට හිමි රිදී සම්මානයෙන් පිදුම් ලැබීය.''

අපගේ භාණ්ඩවල ගුණත්වය පිළිබඳ තවමත් පාරිභෝගිකයන් අතර ගොඩනැගී ඇති කීර්ති නාමය අඛණ්ඩව පවත්වාගෙන යෑම අපගේ අරමුණයි. සේවකයින්ගේ අභිප්‍රේරණය ඉහළ මට්ටමක පවතින බැවින් අපගේ අභිමතාර්ථය වන්නේ තවදුරටත් නිෂ්පාදනයන්ගේ ගුණාත්මක බව හා ඵලදායිතාවය පිළිබඳ මහත් සේ සැලකිල්ලට ගෙන එමගින් රාජ්‍ය දැව සංස්ථාව එහි හිනිපෙත්තට ගෙන ඒමටයි.

අවසාන වශයෙන් සංස්ථාවේ උන්නතිය පිණිස අඛණ්ඩව කැපවී කටයුතු කරන පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, සභාපතිතුමා හා ක්‍රියාකාරි අධ්‍යක්ෂතුමා ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලයේ කැපවීම මා ඉතා අගයකොට සලකන අතර, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන සැපයුම්කරු ලෙස අඛණ්ඩව අප වෙත දැඩි පක්ෂපාතීත්වයක් දක්වමින්, අපගේ සාර්ථකත්වයට අත්තිවාරම සපයන්නා වූ පාරිභෝගික හිතවතුන්ට ද මාගේ කෘතඥතාවය පිරිනමන අතර අපගේ බැඳීම් තව දුරටත් ශක්තිමත් කරනු වස් හැකි උපරිම ශක්‍යතාවයෙන් ඔබ හට අනර්ඝතම නිෂ්පාදන සැපයීමට ද අපි සැදී පැහැදී සිටිමු.

සාර්ථකත්වයේ මාවත ඔස්සේ වේගවත් හා තිර ගමනක් යෑම පිණිස අචල සහයෝගයක් දක්වන මාගේ කළමනාකරණ මඩුල්ලේ සියලුම සහෘදයන්ට සහ සැමදා ලැදියාවෙන්, දැඩි පරිශ්‍රමයකින් හා කැපවීමකින් ක්‍රියාකරනු ලබන 2,186 කට පමණ වන අපගේ කාර්ය මණ්ඩලයට මාගේ අතිශය ගෞරවය පිරිනමන අතර, නන් අයුරින් සහයෝගය ලබාදුන් සියලු දෙනාටත් මාගේ හෘදයාංගම ප්‍රණාමය පුදකර සිටිමි.

**පී.ජී. කුමාරසිංහ සිරිසේන,**
සාමාන්‍යාධිකාරී,
රාජ්‍ය දැව සංස්ථාව.

# අපගේ කාර්යභාරයන්

වනාන්තරවලින් දැව කපා ඉවත්කිරීම, එම දැව ඉරූ දැව හා නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීම, දැව කඳන්, ඉරූ දැව හා නිමි භාණ්ඩ නිෂ්පාදන අලෙවිය සහ යථෝක්ත කාර්යයන් සඳහා කැලෑ මාර්ග ඉදිකිරීම.

දැව කඳන් කිරීමේ මධ්‍යස්ථාන, ඉරුම් මෝල්, තෙල් කැවීමේ හා පරිරක්ෂණ යන්ත්‍රාගාර, දැව වියළීම හා වියළීමේ උඳුන් හා අවශ්‍ය උපකරණ මිළදීගැනීම, ඉදිකිරීම හා ක්‍රියාකරවීම.

දැව අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

දැව අතුරු භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය.

දැව ආනයනය කිරීම.

නව වනවගා ව්‍යාපෘති ආරම්භ කිරීම, නැවත වනවගා කිරීම, කැලෑ සහ වනවගාවන් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම.

කෘෂිකාර්මික නිෂ්පාදන.

දැව ආශ්‍රිත නිමි හා අර්ධ නිමි භාණ්ඩ නිෂ්පාදන අපනයනය කිරීම.

පෞද්ගලික ඉඩම් වලින් දැව මිලදීගැනීම.

වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම.

වේවැල් ආනයනය කිරීම.

නියැඳි පරික්ෂා කිරීම් මගින් දේශීය හා ආනයනය කරන ලද දැව හඳුනා ගැනීම සහ දැව සම්බන්ධ සහතික නිකුත් කිරීම.

දැව කර්මාන්තය ආශ්‍රිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සහතික ප්‍රදානය කිරීම සහ පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

සංස්ථාවට අයත් ඉඩම් හා ගොඩනැගිලිවල සම්පූර්ණ ප්‍රයෝජනය ලබාගැනීම සඳහා සැලසුම් කිරීම සහ ඒ වෙනුවෙන් ආයෝජනය කිරීම.



# අපගේ ව්‍යාපාරික වටිනාකම්



- ඉතාමත් පරිසර හිතකාමී සහ වාණිජ වශයෙන් ජීවමාන රාජ්‍ය අංශයේ ආයතනයක් ලෙස අපගේ ස්ථාවරත්වය පවත්වාගෙන යෑම අපගේ ප්‍රමුඛ වගකීම ලෙස හඳුනාගනිමු.
- පිවිතුරු සහ හිතකාමී පරිසරයක් සුරක්ෂිත කිරීම සඳහා වනාන්තර සහ දැව ඉවත් කිරීමේ විද්‍යානුකූල කළමණාකරණයට සම්බන්ධ සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසීන්ට අනුකූලව එය ඉටු කිරීමට අපි කැපවෙමු.
- අපගේ ගනුදෙනුකරුවන් සමඟ ආචාරශීලි ව්‍යාපාරික සබඳතා ගොඩනඟා ගනිමින්, ඔවුනට සහ සියළුම ශ්‍රී ලාංකීකයන්ට වටිනාකම් නිර්මාණය කිරීම අපගේ පැවැත්මේ මූලික ම කාරණය ලෙස අපි පිළිගන්නෙමු.
- කුසලතා වර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ නිරන්තර අධ්‍යාපනය සහ පුහුණුව තුළින් අපගේ සේවා නියුක්තිකයන්ගේ ඵලදායීතා මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නෙමු.
- අපගේ ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සහ ආචාරශීලී සේවයක් සැපයීම සඳහා අපගේ සියළු කාර්යයන්හි දී ඔවුන්ව මූලිකව තබා ගනිමින් කටයුතු කරන්නෙමු.
- අපගේ සියළුම මෙහෙයුම් කටයුතු වලදී සහ සේවා සැපයීමේදී පුද්ගලික අවංකභාවය ඉතා ඉහළින්ම තබා ගන්නා බවට සහතික වන්නෙමු.
- අපගේ අනාගත පරපුරේ අගනා ජාතික උරුමයන් ලෙස පරිසරය සහ වන සම්පත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සියළුම ව්‍යවස්ථාපිත රෙගුලාසි සහ සමාජීය ප්‍රතිමාන අනුගමනය කරන්නෙමු.

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2014





**එස්.අමරසිංහ මහතා**
- සභාපති, රාජ්‍ය දැව සංස්ථාව

**කෝසල හෙට්ටිආරච්චි මහතා**
- ක්‍රියාකාරී අධ්‍යක්ෂක, රාජ්‍ය දැව සංස්ථාව

**ඒ.කේ.ඒ.වයි.තරංග මහතා**
- අධ්‍යක්ෂක (භාණ්ඩාගාර නියෝජිත)

**එස්.ඒ.ඒ.සතුරුසිංහ මහතා**
- අධ්‍යක්ෂක (වනසංරක්ෂක ජෙනරාල්)

**ඩබ්.එම්.විජේරත්න මහතා**
- අධ්‍යක්ෂක

**මහාචාර්ය හිරාන් එස්. අමරසේකර මහතා**
- අධ්‍යක්ෂක

**මේරි ඩික්මන් මහත්මිය**
- අධ්‍යක්ෂක

# ජ්‍යෂ්ඨ කළමනාකරණ මඬුල්ල - 2014

**පළවන පෙළ**

පී.ජී. කුමාරසිංහ සිරිසේන මහතා
සාමාන්‍යාධිකාරී

**දෙවන පෙළ** *(වමේ සිට දකුණට)*

එම්.වී. කරුණාරත්න මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

කේ. සිරිනිවංස මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පාලන)

ඩී.යූ. දයාරත්න මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණය)

**තෙවන පෙළ** *(වමේ සිට දකුණට)*

ජී. සේනානායක මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)

ඩබ්.ඩබ්.එම්.ජේ. කුරේ මහත්මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගනක)

**සිව්වන පෙළ** *(වමේ සිට දකුණට)*

එච්.එම්.ජී.බී. හේරත් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිෂ්පාදන හා තාක්ෂණ)

ආචාර්ය එන්. රුවන්පතිරණ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පර්යේෂණ, පුහුණු හා සංවර්ධන)

ජී.ඩී.එස්. කුමාරසිංහ මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)







# 2014 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය

මෙම වර්ෂයේ සංස්ථාව විසින් රු.මිලියන 3,474 ක පිරිවැටුමක් ලඟාකරගත් අතර, (පසුගිය වසරේ පිරිවැටුම රු.මිලියන 2,894 කි.) එය පසුගිය වසරට සාපේක්ෂව 20% ක ඉහළයාමකි. පසුගිය වර්ෂයේ දළ ලාභය රු.මිලියන 1,198 ක් වූ අතර, මෙම වර්ෂයේ දළ ලාභය රු.මිලියන 1,453 කි. එය පසුගිය වසරට සාපේක්ෂව 21% ක ඉහළයාමකි. කෙසේවුවත්, පිරිවැටුම වැඩිවීමක් සිදුවුවත්, ඇතැම් රජයේ ප්‍රතිපත්ති, ආර්ථික තත්වයන් සහ දේශපාලනමය සාධක සංස්ථාවේ පිරිවැය වැඩිවීමටත්, සංස්ථාවේ කාර්යසාධනයටත් ඍජුවම බලපාන ලදි.

| කාර්යසාධනය | 2014 (රු. මිලියන) | 2013 (රු. මිලියන) |
|---|---|---|
| | | |
| පිරිවැටුම | 3,474 | 2,894 |
| දළ ලාභය | 1,453 | 1,198 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 60 | 61 |
| මෙහෙයුම් ලාභය | 204 | 124 |
| මෙහෙයුම් නොවන ආදායම් | 223 | 258 |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | 25 | 50 |
| බදු පෙර ශුද්ධ ලාභය | 427 | 382 |




පිරිවැටුම (රු. මි)




දළ ලාභය (රු. මි)

රු.මිලියන 382 ක පසුගිය බදු පෙර ශුද්ධ ලාභයට සාපේක්ෂව මෙම වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.මිලියන 427 ක් දක්වා රු.මිලියන 45 කින් වැඩිවී ඇත. ආයතන, පරිපාලන, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් රු.මිලියන 1,308 දක්වා 15% කින් වර්ධනය වූ අතර, පසුගිය වසරේ එය රු.මිලියන 1,135 කි.



මෙහෙයුම් ලාභය (රු. මි)



මෙහෙයුම් නොවන වෙනත් ආදායම් (රු. මි)




පසුගිය වසරට සාපේක්ෂව විකුණුම් හා බෙදාහැරීමේ වියදම් ඉහළ ගියේ 14% ක් වැනි ප්‍රතිශතයකිනි. ආයතන හා පරිපාලන වියදම් පසුගිය වර්ෂයේ රු.මිලියන 652 ක් වූ අතර, මෙම වර්ෂයේ එය රු.මිලියන 757 කි. එම වැඩිවීම පසුගිය වසරට සාපේක්ෂව 16% කි.

2014 වර්ෂයේ ආයතන, පරිපාලන වියදම් සහ විකුණුම් හා බෙදාහැරීම් වියදම් අඩු කිරීමෙන් පසු විශේෂ භාණ්ඩාගාර බදු සහ ආදායම් බදු පසු ශුද්ධ ලාභය රු.මිලියන 206 කි. එය පසුගිය වසරට සාපේක්ෂව රු.මිලියන 24 ක වැඩිවීමකි.


වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය හා හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 2014 වර්ෂයේ පිළිවෙලින් 8% ක් හා 12% ක් වේ.

| වර්ෂය | වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය |
|---|---|---|
| | | |
| 2014 | 8% | 12% |
| 2013 | 8% | 11% |

2014 වර්ෂයේ රාජ්‍ය ආදායම සඳහා සංස්ථාවේ දායකත්වය රු.මිලියන 1,396 කි. එය පසුගිය වර්ෂයේ රු.මිලියන 1,276 කි.



වෙනත් මෙහෙයුම් ආදායම් (රු. මි)



භාණ්ඩාගාර හා ආදායම් බදු පෙර ශුද්ධ ලාභය (රු. මි)

# නිෂ්පාදනය

## රජයේ කැලෑවලින් දැව හෙළීම්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන කළමනාකරණ සැලැස්මකට අනුව හෙළීම් සඳහා තේක්ක, පයිනස් සහ යුකැලිප්ටස් වැනි වනවගා නිදහස් කරනු ලබන අතර 2013 හා 2014 වර්ෂ වල හෙළීම් සඳහා නිදහස් කර ඇති හෙක්ටයාර් ප්‍රමාණය පහත පරිදි වේ.

| දැව විශේෂය | පූර්ණ හෙළීම් (හෙක්ටයාර්) | | තුනීකිරීම් (හෙක්ටයාර්) | |
|---|---|---|---|---|
| | 2014 | 2013 | 2014 | 2013 |
| තේක්ක | 538.0 | 600.0 | 382.3 | - |
| යුකැලිප්ටස් | 20.0 | 26.0 | 98.0 | 352.2 |
| පයිනස් | 136.3 | 124.6 | - | - |
| කායා | - | - | - | - |
| ඇකේෂියා | 9.0 | 27.0 | 6.5 | - |

## ඉරූ දැව පරිවර්තනය කිරීම

2013 වර්ෂයේ ඉරූදැව නිෂ්පාදනය ඝන මීටර් 4,117 ට සාපේක්ෂව 2014 වර්ෂය තුළදී ඉරූදැව ඝන මීටර් 4,239 ක් ඉරුම්හල් මගින් නිෂ්පාදනය කර ඇති අතර, ඝන මීටර් 2,567 ක් දිවයින පුරා පිහිටා ඇති දැව අලෙවි ගබඩා මගින් අලෙවි කර ඇත.

## විදුලි කණු සහ සිල්පර පරිරක්‍ෂණය කිරීම

2014 වර්ෂය තුලදී සිල්පර 39,389 ක්, විදුලිකණු 41,332 ක් හා අලිවැටකණු 38,630 ක් රාජ්‍ය දැව සංස්ථාවේ කල්දෙමුල්ල, කැප්පෙටිපොල හා බූස්ස පරිරක්‍ෂණාගාර වලින් පරිරක්‍ෂණය කර ඇත. පසුගිය වසරට සාපේක්‍ෂව 2014 වසරේ සිල්පර නිෂ්පාදනයේ සැලකිය යුතු පසුබෑමක් දක්නට ඇත.

## ගෘහභාණ්ඩ නිෂ්පාදනය

රාජ්‍ය දැව සංස්ථාවේ අම්පාර, කල්දෙමුල්ල හා බූස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර වලින් රුපියල් මිලියන 260.4 ක් වටිනා ගෘහභාණ්ඩ සලකා බලන වර්ෂය තුලදී නිෂ්පාදනය කර ඇත.ඒ අතර රුපියල් මිලියන 238.3 ක් වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ රාජ්‍ය දැව සංස්ථාවේ රත්මලාන, මහනුවර, රත්නපුර, තලල්ල, බූස්ස හා අම්පාර ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර වලින් අලෙවි කර ඇත.




## 2013 - 2014 වර්ෂවල නිෂ්පාදනය, අලෙවිය හා ආදායම

| | | නිෂ්පාදන ප්‍රමාණය | | අලෙවි ප්‍රමාණය | | දළ පිරිවැටුම (රු.මි.) | |
|---|---|---|---|---|---|---|---|
| | | 2014 | 2013 | 2014 | 2013 | 2014 | 2013 |
| කඳන් | ඝ.මී | 131,162 | 106,122 | 118,231 | 96,560 | 2,336.8 | 1,958.0 |
| ඉරූදැව | ඝ.මී | 4,239 | 4,117 | 2,567 | 2,487 | 185.4 | 182.2 |
| සිල්පර | ඒකක | 39,389 | 37,526 | 64,761 | 64,938 | 568.7 | 527.3 |
| විදුලිකණු | ඒකක | 41,332 | 31,887 | 32,567 | 29,413 | 314.0 | 222.2 |
| අලිවැටකණු | ඒකක | 38,630 | 26,475 | 36,088 | 37,827 | 104.5 | 100.2 |
| වටකණු | ඒකක | 126,333 | 105,299 | 126,130 | 107,224 | 12.8 | 10.7 |
| දර | ඝ.මී | 105,537 | 85,156 | 102,301 | 86,922 | 47.0 | 39.3 |
| වැටකණු | ඒකක | 110,254 | 88,685 | 116,635 | 83,927 | 9.8 | 7.6 |






*රාජ්‍ය දැව සංස්ථාවේ අම්පාර, කල්දෙමුල්ල හා බූස්ස ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර වලින් රුපියල් මිලියන 260.4 ක් වටිනා ගෘහභාණ්ඩ සලකා බලන වර්ෂය තුලදී නිෂ්පාදනය කර ඇත.ඒ අතර රුපියල් මිලියන 238.3 ක් වටිනාකමින් යුත් ගෘහභාණ්ඩ රාජ්‍ය දැව සංස්ථාවේ රත්මලාන, මහනුවර, රත්නපුර, තලල්ල, බූස්ස හා අම්පාර ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර වලින් අලෙවි කර ඇත.*




## අපගේ ආවරණ කලාප

ප්‍රාදේශීය කාර්යාල 12ක්, දිවයින පුරා ක්‍රියාත්මක වන දැව අලෙවි ගබඩා 54ක්, කල්දෙමුල්ල, අම්පාර සහ බූස්ස යන ස්ථානයන් හි ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර 3ක්, මහනුවර, රත්නපුර, තලල්ල, අම්පාර, කල්දෙමුල්ල සහ බූස්ස, යන ස්ථානයන්හි ගෘහභාණ්ඩ ප්‍රදර්ශනාගාර 6 ක්ද කැප්පෙටිපොළ, කල්දෙමුල්ල සහ බූස්ස යන ස්ථානවල දැව පරිරක්ෂණාගාර 03ක්, ලී මෝල් 06ක් අම්පාර, මහනුවර, බූස්ස, කල්දෙමුල්ල, රත්මලාන සහ තලල්ල යන ස්ථානවලත්, බණ්ඩාරවෙල ලී මෝල් 04 ක්, රත්නපුර ලී මෝල් 02ක්, කැප්පෙටිපොළ ලී මෝල් 04ක් සහ කුරුණෑගල ලී මෝල් 02 ක් ද ආදී වශයෙනුත් පවත්වා ගනිමින් රටේ සෑම කොටසක්ම ආවරණය වන පරිදි, රටේ සමස්ථ ජනකොට්ඨාශ වෙත සේවා සැපයිය හැකි පරිදි අපගේ මෙහෙයුම් ව්‍යුහය ඉතාමත් හොඳින් සැලසුම් කර ඇත.






### අම්පාර ප්‍රාදේශිකය





### අනුරාධපුර ප්‍රාදේශිකය





### බණ්ඩාරවෙල ප්‍රාදේශිකය



## කොළඹ ප්‍රාදේශිකය




## යාපනය ප්‍රාදේශිකය





## මහනුවර ප්‍රාදේශිකය







## කුරුණෑගල ප්‍රාදේශිකය





## මොණරාගල ප්‍රාදේශිකය




## මාතර ප්‍රාදේශිකය




## නුවරඑළිය ප්‍රාදේශිකය




## පොළොන්නරුව ප්‍රාදේශිකය




## රත්නපුර ප්‍රාදේශිකය






## ඉලක්ක හා සපුරාගැනීම් පිළිබඳ සමාලෝචනය සහ අධීක්ෂණය

සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් හා සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සහභාගීත්වයෙන් මාසිකව කළමනාකරණ රැස්වීම් පවත්වනු ලබන අතර, එහිදී සත්‍ය කාර්යසාධනය, නිෂ්පාදනය සහ අලෙවි ඉලක්ක සමග සසඳා බලනු ලැබේ. මෙම රැස්වීම් වලදී සියලුම බාධක හා ගැටළු අදාල ප්‍රාදේශීය කළමනාකරුවන් සමග සාකච්ඡා කර හඳුනාගනු ලබන අතර, ඒ සම්බන්ධ විවිධ තීරණ හා විකල්ප ක්‍රියාමාර්ග යෝජනා කර පසුව එම යෝජනා ඇගයීමට ලක්කර ක්‍රියාත්මක කරනු ලැබේ. තවද සංස්ථාවේ අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ අභිලාෂයෙන් හා අපේක්ෂිත මුදල් ප්‍රවාහය ළඟාකරගෙන මුල්‍යමය අතින් ශක්තිමත් ආයතනයක් බවට තහවුරු කිරීමේ අරමුණින් නව අවස්ථාවන්, නව අදහස් හා කළයුතු වෙනස්කම් සම්බන්ධයෙන් ද සාකච්ඡා කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ



එස්.අමරසිංහ,
සභාපති,
රාජ්‍ය දැව සංස්ථාව.

*රටේ සෑම කොටසක්ම ආවරණය වන පරිදි, රටේ සමස්ථ ජනකොට්ඨාශ වෙත සේවා සැපයිය හැකි පරිදි අපගේ මෙහෙයුම් ව්‍යුහය ඉතාමත් හොඳින් සැලසුම් කර ඇත.*



## රාජ්‍ය දැව සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්

| | |
|---|---|
| ඒ.කේ.ඒ.වයි. තරංග මහතා | - කමිටු සභාපති |
| ඒ. සතුරුසිංහ මහතා | - කමිටු සාමාජික |
| මහාචාර්ය හිරාන් අමරසේකර මහතා | - කමිටු සාමාජික |

2014 වර්ෂයට අදාලව පහත සඳහන් කරුණු අදාල රැස්වීම්වලදී සාකච්ඡා කර ඇති අතර, එහිදී ගන්නා ලද තීරණ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලදී.

1. මාසික මූල්‍ය හා භෞතික කාර්යසාධනය
2. වාර්ෂික ගිණුම්
3. වාර්ෂික අයවැය හා සංශෝධිත අයවැය
4. අභ්‍යන්තර විගණන හා විගණකාධිපතිගේ විගණන විමසුම් හා පිළිතුරු
5. පිරිස් හා පාලන කාර්යයන්
6. නීති කටයුතු
7. සේවක ණය, අත්තිකාරම් සහ ටෙන්ඩර් පිරිනැමීම

**ඒ.කේ.ඒ.වයි. තරංග මහතා**
**සභාපති - විගණන හා කළමනාකරණ කමිටුව**






පසුගිය වාර්තා අනුව වසර අටක සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වාගෙන යාම පිළිබඳව හා මුදල් තත්ත්වය ඉහළ නැංවීම දැක්වෙන සංක්ෂිප්තය.


වසර අටක් තුළ මූල්‍ය කාර්යසාධනයේ සංක්ෂිප්තය, මුදල් ප්‍රවාහය, මූල්‍යමය වත්කම් හා වගකීම්, ප්‍රාග්ධන වියදම් සහ ලාභ ආදියෙන් සමන්විත වේ. සංස්ථාව ලබා ඇති ලාභ හා වියදම් පෙන්නුම් කරන දර්ශකයන් මගින් ආයෝජන සැලසුම් හා ක්‍රියාකාරී සැලසුම් මනා මුදල් පාලනයක් ඇතිව ක්‍රියාත්මක කර ඇති බවට සාක්ෂි දරනු ඇත. පසුගිය වසර තුළ මුදල්මය වශයෙන් ලබා ඇති දියුණුව තුළින් සංස්ථාවේ මූල්‍ය ස්ථාවරත්වය හා තිරසාරත්වය පිළිබඳව ඉදිරි කාලය සඳහා පියවර ගෙන ඇති බව තහවුරු වේ. තවද මුදල් අංශයේ සහ මෙහෙයුම් අංශයේ සියලු අරමුණු සාක්ෂාත් කරගැනීම තුළින් ආයතනික සැලැසුම් අනුව කටයුතු කර ඇත.

## ආදායම් වර්ධන ප්‍රවනතා විශ්ලේෂණය

බදු සහිත (රු.000)





බදු රහිත (රු.000)





## ලාභ වර්ධන ප්‍රවණතා විශ්ලේෂණය


දළ ලාභය (රු.000)




ආදායම් හා භාණ්ඩාගාර බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය (රු.000)




## මෙහෙයුම් ලාභය (රු.)





## නිෂ්පාදනය වර්ධනය වීමේ ප්‍රවණතා විශ්ලේෂණය


කඳන් නිෂ්පාදනය (ඝ.මී)





ඉරූ දැව නිෂ්පාදනය (ඝ.මී)




සිල්පර නිෂ්පාදනය (ඒකක)





විදුලි සම්ප්‍රේෂණ කණු නිෂ්පාදනය (ඒකක)








ගෘහභාණ්ඩ නිෂ්පාදනය (රු. මිලියන)




අලි වැට කණු නිෂ්පාදනය (ඒකක)




## අගය එකතු කිරීම



## ප්‍රාග්ධන ආයෝජන - 2014

| විස්තරය | රු. |
|---|---|
| බොරලන්ද සේවක නිල නිවාස - "දැව නිවහන" | 10,156,750 |
| බොයිලේරු යන්ත්‍ර - වී.බී.සී 02 ටොන් | 9,347,233 |
| හයිනෝ ක්‍රේන් ලොරි - 05 | 40,565,964 |
| තලාව නව ගොඩනැගිල්ල | 5,200,620 |
| බොයිලේරුව සහිත ගොඩනැගිල්ල | 3,071,820 |
| පරිරක්ෂණාගාරය වැඩිදියුණු කිරීම | 2,776,696 |
| ඔඩ්ඩුසුඩාන් දැව ගබඩාව | 2,498,823 |
| Holytek (taiwan) yrt-115 "rectangular tenoner" | 2,410,268 |
| පරිඝනක යන්ත්‍ර - ලෙනොවෝ 25 | 2,300,000 |
| ඉරුම්හල් ගොඩනැගිල්ල | 2,212,649 |

| ආයෝජන | 31-12-2013 | 31-12-2014 |
|---|---|---|
| | රු. | රු. |
| රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත අරමුදල් ගිණුම | 338,010,495 | 360,226,630 |
| මහජන බැංකුව | 811,508,552 | 696,410,412 |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය | 500,000 | 500,000 |
| ලංකා බැංකුව | 509,082,847 | 877,910,713 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 81,474,846 | 130,485,324 |
| සී/ස ලංකා ටිම්බර් ප්ලාන්ටේෂන් සමාගම | 30,000,000 | - |
| එකතුව | **1,770,576,739** | **2,065,533,079** |



## දශකයක තොරතුරු

| (නිරපේක්ෂ සංඛ්‍යා) | | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුළු වාර්ෂික ආදායම | රු.'000 | 1,529,079 | 2,106,155 | 2,531,611 | 2,986,925 | 3,445,141 | 3,616,164 | 3,103,744 | 3,563,390 | 3,213,547 | 3,756,482 |
| වාර්ෂික දළ ලාභය | රු.'000 | 899,729 | 966,095 | 1,050,896 | 1,210,845 | 1,351,695 | 1,365,285 | 1,237,640 | 1,546,107 | 1,197,518 | 1,453,451 |
| පොළී සහ ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය | රු.'000 | 457,750 | 480,641 | 488,535 | 647,039 | 810,612 | 877,623 | 603,499 | 801,681 | 382,337 | 427,222 |
| මුළු සේවක පිරිවැය | රු.'000 | 596,684 | 774,751 | 841,831 | 852,879 | 898,652 | 901,910 | 953,498 | 1,065,052 | 1,117,036 | 1,254,516 |
| වාර්ෂික ප්‍රාග්ධන වියදම් | රු.'000 | 2,051 | 13,523 | 95,745 | 141,327 | 112,909 | 237,332 | 180,546 | 162,509 | 332,870 | 115,132 |
| වර්ෂාවසාන ජංගම නොවන වත්කම් | රු.'000 | 1,372,833 | 1,579,613 | 1,338,570 | 1,523,553 | 1,793,467 | 1,801,988 | 1,739,893 | 1,479,880 | 1,658,535 | 1,654,908 |
| වර්ෂාවසාන ජංගම වත්කම් | රු.'000 | 852,622 | 962,569 | 1,545,428 | 1,407,022 | 2,079,543 | 2,341,020 | 2,177,892 | 2,929,185 | 3,153,777 | 4,004,860 |
| වර්ෂාවසාන ජංගම වගකීම් | රු.'000 | 285,475 | 528,005 | 690,558 | 455,460 | 1,028,979 | 1,034,258 | 497,229 | 804,102 | 1,050,258 | 1,591,991 |
| වර්ෂාවසාන ජංගම නොවන වගකීම් | රු.'000 | 285,339 | 341,581 | 370,816 | 362,399 | 364,553 | 399,057 | 399,953 | 409,030 | 384,831 | 484,649 |
| වර්ෂාවසාන ස්කන්ධය | රු.'000 | 1,654,641 | 1,672,595 | 1,822,624 | 2,112,716 | 2,479,478 | 2,709,694 | 3,020,602 | 3,195,933 | 3,377,223 | 3,583,129 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | රු.'000 | 50,000 | 75,000 | 150,000 | 75,000 | 50,000 | 413,490 | 75,000 | 600,000 | 50,000 | 25,000 |
| වර්ෂාවසාන සේවක සංඛ්‍යාව | සංඛ්‍යාව | 2,846 | 2,751 | 2,634 | 2,499 | 2,457 | 2,346 | 2,267 | 2,187 | 2,139 | 2,186 |
| වර්ෂාවසාන අතිරික්ත අරමුදල් ආයෝජන ශේෂය | රු.'000 | 1,047,004 | 1,267,102 | 834,037 | 777,101 | 858,717 | 605,235 | 764,328 | 298,546 | 338,010 | 360,227 |
| **ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක** | | | | | | | | | | | |
| ස්කන්ධයට ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය | % | 27.66 | 28.74 | 26.80 | 30.63 | 32.69 | 32.39 | 19.98 | 25.08 | 11.32 | 11.92 |
| මුළු වත්කම් වලට පොළී හා බදුවලට පෙර ශුද්ධ ලාභය | % | 20.57 | 18.91 | 16.94 | 22.08 | 20.93 | 21.18 | 15.40 | 18.18 | 7.94 | 7.55 |
| ජංගම අනුපාතය | වාර ගණන | 2.99 | 1.82 | 2.24 | 3.09 | 2.02 | 2.26 | 4.38 | 3.64 | 3.00 | 2.52 |
| එක් සේවකයෙකුට සේවක පිරිවැය | රු.'000 | 210 | 282 | 320 | 341 | 366 | 384 | 421 | 487 | 522 | 574 |
| ස්කන්ධයට වත්කම් අනුපාතය | වාර ගණන | 1.34 | 1.52 | 1.58 | 1.39 | 1.56 | 1.53 | 1.30 | 1.38 | 1.42 | 1.58 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | % | 20.57 | 18.91 | 16.94 | 22.08 | 20.93 | 21.18 | 15.40 | 18.18 | 7.94 | 7.55 |
| මුළු පිරිවැටුම් වර්ධනය | % | 19.99 | 37.74 | 20.20 | 17.99 | 15.34 | 4.96 | (14.17) | 14.81 | (9.82) | 16.89 |



# ජාතික ආර්ථිකයට රාජ්‍ය දැව සංස්ථාවේ දායකත්වය

රටේ ආර්ථික දියුණුව උදෙසා නවෝත්පාදන බිහිකිරීමටත්, ඵලදායී ලෙස ප්‍රාග්ධනය හා නිපුණතා භාවිතයට පෙළඹවීමත්, නව භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රමෝපායන් හඳුන්වාදෙමින් වෙළඳපොළ සංවර්ධනය කිරීමටත් කටයුතු කරමින් පවතී.

# ජාතික ආර්ථිකයට රාජ්‍ය දැව සංස්ථාවේ දායකත්වය.

දැව කර්මාන්තයේ ප්‍රමුඛයා ලෙස වැජඹෙන රාජ්‍ය දැව සංස්ථාව ආර්ථික වර්ධනය හා සංවර්ධනය උදෙසා අනඟි මෙහෙවරක් ඉටුකරයි. රාජ්‍ය දැව සංස්ථාව දැව කර්මාන්ත අංශයේ දියුණුව සඳහා පමණක් නොව, අනෙකුත් අංශයන්ගේ දියුණුව සඳහා ද වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. වර්ෂ 2014 දී රු.මිලියන 1,396 ක ස්කන්ධ භාග එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, ආදායම් බදු සහ භාණ්ඩාගාරයට ගෙවූ බදු වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයා ඇත.

**2010 - 2014 වර්ෂවල ස්කන්ධභාග, එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු, ආදායම් බදු සහ භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු සාරාංශය පහතින් දක්වේ.**

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| ස්කන්ධ භාග | 758,318,131 | 777,852,620 | 831,555,555 | 706,779,429 | 743,675,772 |
| එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු | 520,464,311 | 433,254,605 | 447,825,030 | 387,928,678 | 424,740,460 |
| ආදායම් බදු | 253,586,600 | 242,640,682 | 192,453,384 | 131,882,763 | 202,347,603 |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | 413,490,090 | 75,000,000 | 600,000,000 | 50,000,000 | 25,000,000 |
| මුළු දායකත්වය | 1,945,859,132 | 1,528,747,907 | 2,071,833,969 | 1,276,590,870 | 1,395,763,835 |

## ජාතික ආර්ථිකයේ උන්නතිය උදෙසා රාජ්‍ය දැව සංස්ථාවේ දායකත්වය.

1. රාජ්‍ය දැව සංස්ථාව සමාජයේ වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබාදෙමින්, ජාතික ආර්ථික සංවර්ධනයට බලපාන ප්‍රබල සාධකයක් වන සේවා වියුක්තිය පහත හෙළීමට මහඟු මෙහෙවරක් ඉටුකරමින් පවතී.

2. රාජ්‍ය දැව සංස්ථාව අති දුෂ්කර ප්‍රදේශවල ප්‍රාදේශීය කාර්යාල පිහිටුවමින් ප්‍රාදේශීය සංවර්ධනය ඇති කිරීමටත්, ප්‍රාදේශීය විෂමතා ඉවත් කිරීමටත් කටයුතු කරයි. එවැනි ප්‍රදේශවල ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමෙන් පොදු පහසුකම් රැසක් වැඩිදියුණු වීමට මඟපාදා ඇත.


3. රටේ ආර්ථික දියුණුව උදෙසා නවෝත්පාදන බිහිකිරීමටත්, ඵලදායී ලෙස ප්‍රාග්ධනය හා නිපුණතා භාවිතයට පෙළඹවීමත්, නව භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රමෝපායන් හඳුන්වාදෙමින් වෙළඳපොළ සංවර්ධනය කිරීමටත් කටයුතු කරමින් පවතී.

4. රටේ ජනතාවගේ ජීවන තත්වය උසස්වීම යනු ආර්ථික සංවර්ධනයේ ප්‍රබලම අංගයකි. සාධාරණ මිලකට ඉහළ ගුණත්වයෙන් යුත් භාණ්ඩ සපයමින්, විවිධ භාණ්ඩ හා සේවා වෙළඳපොළට හඳුන්වාදීමටත්, සමාජයට මෙන්ම පරිසරයටත් හිතකර නිෂ්පාදන තුළින් ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබාදීමටත් රාජ්‍ය දැව සංස්ථාව කටයුතු කරමින් පවතී.

5. ආර්ථිකයේ සුභදායී පැවැත්ම හා සංවර්ධනය සහතික කිරීමට හේතුවන, ආනයන වෙළඳපොළට එරෙහිව විදේශ විනිමය ආදායම ඉහළ නැංවීමට රාජ්‍ය දැව සංස්ථාව අපනයන වෙළඳපොළ කරා ප්‍රවේශ වීමෙන් විදේශ විනිමය ඉපැයීමට කටයුතු යොදමින් පවතී.







*රටේ ජනතාවගේ ජීවන තත්වය උසස්වීම යනු ආර්ථික සංවර්ධනයේ ප්‍රබලම අංගයකි. සාධාරණ මිලකට ඉහළ ගුණත්වයෙන් යුත් භාණ්ඩ සපයමින්, විවිධ භාණ්ඩ හා සේවා වෙළඳපොළට හඳුන්වාදීමටත්, සමාජයට මෙන්ම පරිසරයටත් හිතකර නිෂ්පාදන තුළින් ආර්ථිකයට ඉහළ දායකත්වයක් ලබාදීමටත් රාජ්‍ය දැව සංස්ථාව කටයුතු කරමින් පවතී.*

6. රාජ්‍ය දැව සංස්ථාව, දැව වෙළඳපොළේ ඒකාධිකාරී බලයක් ඇතිවීම වැලැක්වීම සඳහා දැව කර්මාන්තයේ සම්පූර්ණ ක්‍රියාවලියට සම්බන්ධ වෙමින් හා එය පාලනය කරමින් රාජ්‍ය හා ජාතික මට්ටමේ පහසුකම් සැලසීමට දායක වෙයි.

7. රටේ වැඩි පිරිසක් අතරත්, විවිධ භූගෝලීය ප්‍රදේශයන් අතරත්, සාධාරණ ආදායම් හා ධන ව්‍යාප්තියක් ඇති කිරීම සඳහා පෙළඹවීම.

8. සමාජ වගකීමෙන් යුක්ත රාජ්‍ය දැව සංස්ථාව පරිසරය ආරක්ෂා කිරීමටත්, පරිසර හිතකාමී කාර්යයන් ප්‍රවර්ධනය කිරීමටත් විවිධ වැඩසටහන් මෙහෙයවමින් පවතී.



# සංස්ථාපිත පාලනය

සංස්ථාපිත පාලනය යනු ආයතනයේ ව්‍යුහය හා සම්බන්ධතාවය පිළිබඳ මනා අවබෝධයක් ලබාදීම මගින් ආයතනයේ දිශාව හා කාර්යසාධනය තීරණය කෙරෙන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාපිත පාලනයේ වගකීම් දරන්නෝ වෙති.



***සංස්ථාපිත පාලනය යනු ආයතනයේ ව්‍යුහය හා සම්බන්ධතාවය පිළිබඳ මනා අවබෝධයක් ලබාදීම මගින් ආයතනයේ දිශාව හා කාර්යසාධනය තීරණය කෙරෙන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාපිත පාලනයේ වගකීම් දරන්නෝ වෙති.***

1. රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ සමස්ථ සේවක ප්‍රජාව රාජකාරි කටයුතුවලදී මෙන්ම අනෙකුත් සෑම අවශ්‍යතාවයකදීම රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රතිරූපය සහ කීර්තිනාමය ඔසවා තැබීම සඳහා ආයතනික සංස්ථාපිත පාලනයට හැඩ ගැසීම අත්‍යාවශ්‍ය වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලය

- සංස්ථාවේ කළමනාකාරිත්වය හසුරුවීම හා අධීක්ෂණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන භූමිකාව වේ.
- අධ්‍යක්ෂවරු හා නිලධාරීන් රාජ්‍ය දැව සංස්ථාවේ භාරකරුවෝ වෙති. එනම්, ඔවුන් පක්ෂපාතීව හා උපරිම විශ්වාසයකින් සංස්ථාව හා බැඳී සිටින අතර, එහි යහපත වෙනුවෙන් පමණක් කටයුතු කළ යුතුය.
- අධ්‍යක්ෂවරු සහ නිලධාරීන් ඔවුන්ට අදාල නීතිවලට අනුව ඔවුන්ගේ යුතුකම්වලට අනුකූල විය යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, ක්‍රියාකාරි අධ්‍යක්ෂ, වන සංරක්ෂණ ජනරාල්, භාණ්ඩාගාර නියෝජිත සහ නීතිඥවරු ඇතළුව සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත වේ. ආයතනයට වැදගත් සියලුම ප්‍රධාන තීරණ ගැනීම සඳහා මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වයි. අධ්‍යක්ෂවරු ඇල්මැති පාර්ශවයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීමෙන් යුක්ත වන අතර, සංස්ථාවේ සමස්ත කළමනාකරණය සඳහා ඔවුන් වගකිව යුතුවේ.

## ව්‍යවස්ථාපිත බැඳීම්

1. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද වාර්ෂික අයවැය වර්ෂාරම්භයට පෙර අමාත්‍යංශයට, භාණ්ඩාගාරයට හා විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතුය.

2. මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත වාර්ෂික වාර්තාවේ සහ ගිණුම්වල කෙටුම්පත් විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතුය.

3. මූල්‍ය වර්ෂය අවසන් වී දින 150ක් ඇතුලත භාෂා තුනෙන්ම සමන්විත විගණනය කරන ලද අවසාන ගිණුම් සහ විගණක වාර්තාව පාර්ලිමේන්තවේ සභාගත කළ යුතුය.

4. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම අමාත්‍යංශයට, භාණ්ඩාගාරයට හා විගණකාධිපතිතුමාට ඉදිරිපත් කළ යුතුය.

## විගණන කමිටුව

මූල්‍ය කළමනාකරණ කුසලතා සපිරි අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සාමාජිකයන්ගෙන් සහ භාණ්ඩාග ාර නියෝජිතයෙකුගෙන් කමිටුව සමන්විත වේ. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, සංස්ථාවේ කාර්යසාධනය, වාර්ෂික විගණන සැලැස්ම, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සමාලෝචනය කිරීමේ අරමුණින් මෙම කමිටුව මාස තුනකට වරක්වත් එක්රැස් වේ.



## කළමනාකරණ රැස්වීම

රාජ්‍ය දැව සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහභාගී වන කළමනාකරණ රැස්වීම් වලදී නිෂ්පාදන, අලෙවිකරණ, විකුණුම් හා මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය හා ඇගයීමට ලක් කෙරේ. මීට අමතරව කළමනාකරණ රැස්වීම්වලදී ආයතනයේ මූලික ප්‍රශ්න හා සංරෝධන සාකච්ඡා කරන අතර ඒවාට අවශ්‍ය විසඳුම් පිළිබඳ තීරණ ගනුලැබේ.

## ප්‍රාදේශික කාර්යසාධන කළමනාකරණ රැස්වීම්

මෙම රැස්වීම විශේෂයෙන්ම වනාන්තර වැඩබිම් භාර වැඩබිම් නිලධාරීන්, විකුණුම් භාර ගබඩා නිලධාරීන් සහ අනෙකුත් ප්‍රාදේශික කාර්ය මණ්ඩලය වෙනුවෙන් පවත්වනු ලබයි. ප්‍රාදේශිකයන්ගේ කාර්යසාධනය අගය කිරීම සහ නිෂ්පාදනය මෙන්ම විකුණුම් මත ඉලක්ක ඇති කිරීම මෙම රැස්වීම්වල අරමුණ වේ. විවිධ දුෂ්කරතා සහ අවස්ථා හඳුනාගැනීමටත්, ප්‍රශ්නවලට අදාළව තීරණගැනීමටත් මෙම රැස්වීම් මඟින් හැකිවේ.

## තාක්ෂණික ඇගයීම් කමිටුව


ටෙන්ඩර් පත්‍රිකා ඇගයීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට රාජ්‍ය ප්‍රසම්පාදන නීතිවලට අනුව මෙම කමිටුව පත්කරනු ලබයි.

රාජ්‍ය දැව සංස්ථාව එහි වාර්ෂික වාර්තාව සෑම වර්ෂයකදීම ගිවිසගත් කාලය තුලදී ප්‍රකාශයට පත්කරනු ලබයි. වාර්ෂික වාර්තාව ඇල්මැති පාර්ශවයන්ගේ අවශ්‍යතා සඳහා පිළියෙල කරනු ලබන අතර, සංස්ථාවේ මූල්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ස්ථාපිත යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සමඟ අනුකූල විය යුතුය.

## ඇල්මැති පාර්ශවයන් සමඟ පවතින සම්බන්ධතාව.

ප්‍රධාන ඇල්මැති පාර්ශවයන් සමඟ හිතකර සම්බන්ධතාවයක් පවත්වාගෙන යාමේ වැදගත්කම අධ්‍යක්ෂ මණ්ඩලය වටහාගෙන ඇත. අභ්‍යන්තර සන්නිවේදනය මූලිකවම විද්‍යුත් තැපැල, සන්නස් පත්‍ර, චක්‍ර ලේඛන සහ දැන්වීම් හරහා සිදුවේ. එසේම සංස්ථාවේ ප්‍රතිපත්ති සහ භාවිතයන්, සංස්ථාවේ වටිනාකම් හා සමාජ වගකීම් සමඟ අනුකූල වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. සංස්ථාව එහි අභ්‍යන්තර හා බාහිර පරිසරය ආරක්ෂා කිරීමට අනුබල දෙයි.






රාජ්‍ය ද්‍රව සංස්ථාවේ වාර්ෂික වාර්තාව
වර්ෂය තුල මුහුණ පෑ අවස්ථා සහ සංරෝධන දක්වන සභාපතිතුමාගේ සමාලෝචනය
විගණන කමිටුව
විගණකාධිපතිතුමාගේ වාර්තාව
පසුගිය වර්ෂයේ දත්ත ඇතුළුව මූල්‍ය සාරාංශය
විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන
වර්ෂය තුල වූ මෙහෙයුම්වල කාර්යසාධනය ඉස්මතු කරන්නා වූ සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය
අධ්‍යක්ෂවරු සහ ජ්‍යෙ.කළමනාකාරිත්වය පිළිබඳ කෙටි හැඳින්වීමක්







## ව්‍යවස්ථාපිත හා නෛතික අවශ්‍යතාවලට අනුකූලවීම.

46 වසරක් පුරා ජාතියේ විශ්වාසනීයත්වය දිනූ අනර්ඝතම දැව හා දැවමය භාණ්ඩ සැපයීමේ පුරෝගාමී නායකයා ලෙස රාජ්‍ය දැව සංස්ථාව අද්විතීය ස්ථානයක් හිමිකරගෙන ඇත. රාජ්‍ය දැව සංස්ථාව 1968 වර්ෂයේදී ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ගරු අමාත්‍යතුමන් විසින් 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ බලතල ප්‍රකාරව පිහිටුවන ලද අතර, 1982 පෙබරවාරි 05 දිනැති අංක:178/10, 5.2 නමැති විශේෂ ගැසට් නිවේදනය සහ 2009 වර්ෂයේ ජුනි 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර අංක:11907 ට අනුව තවදුරටත් සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී.

රාජ්‍ය දැව සංස්ථාව ජාතික ආර්ථිකයට ඇති දායකත්වය පිළිබඳව සන්තෘප්ත විය හැකිය. රජය ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමේ හා සංරක්ෂණය කිරීමේ අරමුණින් නියම කරන ලද ප්‍රදේශවල අනවසර ගස් හෙළීම වලක්වාලීම සඳහා කටයුතු කිරීම සංස්ථාවට ඇති විශාලම අභියෝගය වේ. මෙය සංස්ථාවේ ව්‍යාපාර කටයුතු සඳහා දැඩි බලපෑමක් ඇති කරයි.

වගකීමෙන් යුතු ආයතනික පුරවැසියෙකු ලෙස රාජ්‍ය දැව සංස්ථාව පසුකාලීන සංශෝධනයන් ඔස්සේ රජයේ පනත් සහ නියෝගවලට අනුකූල වෙමින් එහි කටයුතු සාර්ථකව පවත්වාගෙන යයි.

- 1966 අංක 13 දරන වන ආඥා පනත
- 1971 අංක 38 දරන මූල්‍ය පනත
- 1954 අංක 15 දරන සාප්පු හා කාර්යාල සේවක පනත
- 1958 අංක 15 දරන සේවක භාරකාර අරමුදල
- 1980 අංක 46 දරන සේවක අර්ථසාධක අරමුදල
- 2006 අංක 10 දරන ආදායම් බදු පනත
- 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත
- 2009 අංක 09 දරන ජාතික ගොඩනැගීමේ බදු පනත

රාජ්‍ය අණ පනත් හා නියෝග වලට අමතරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS සහ LKAS)ශ්‍රී ලංකා විගණන ප්‍රමිත රාජ්‍ය දැව සංස්ථාවේ ගිණුම්කරණ හා විගණන කාර්යයන් සඳහා අදාල වේ.

සංස්ථාව ඉලක්ක ලඟාකරගත් ප්‍රමාණය සහ සමාජ වගකීම් සපුරාලීමේ ප්‍රමාණය නිශ්චය කරගැනීම සඳහා වාර්ෂික ගිණුම් හා කාර්යසාධනය සමාලෝචනය කිරීමේ බලය පැවරී ඇත්තේ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවටයි.
අප සංස්ථාවේ ප්‍රධාන අමුද්‍රව්‍ය නම් ඉතා වටිනා ස්වභාවික සම්පතක් වන ශාක වේ. එසේම අප සමස්ත මෙහෙයුම් ක්‍රියාවලිය සෘජු හා වක්‍රාකාරයෙන් පරිසරය සමඟ සම්බන්ධවේ. මෙවැනි අවස්ථාවන් යටතේ නීතිමය රාමුවට අනුකූලවීම අත්‍යවශ්‍ය වේ. අප සංස්ථාව මේ වනවිටත් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පනවන නීති හා රෙගුලාසිවලට අනුකූල වී ඇත.
දිවයින පුරා විහිදී ඇති අප මෙහෙයුම් ජාලය ඉරුම්හල්, පරිරක්ෂණ යන්ත්‍ර, බොයිලේරු, පෝරණු සහ ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාර වලින් සමන්විත වේ. නිෂ්පාදනාගාර වලින් ඉවත් කෙරෙන පරිසරයට අහිතකර ලෙස බලපාන බාහිරතා පහත හෙළීම සඳහා සංස්ථාව විසින් පාලන පද්ධතියක් භාවිතා කරයි. මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය අප මෙහෙයුම් කටයුතු පරිසර හිතකාමී අයුරින් පවත්වාගෙන යාම සඳහා විවිධ අංශයන් යටතේ නීති හා උපක්‍රම පනවා ඇත.

මේ අනුව සංස්ථාව ශබ්ද දූෂණය, ජල දූෂණය, වාත දූෂණය, කැළිකසල සහ අනෙකුත් පරිසරය දූෂණය වන ක්‍රියාවන් සඳහා පරිසර දූෂණ අවම කිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කරයි.

ගෘහභාණ්ඩ නිෂ්පාදනාගාරයන්ගෙන් හා ඉරුම්හල් වලින් සමන්විත රාජ්‍ය දැව සංස්ථාවේ සේවා ඒකක සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් වාර්ෂිකව පරිසර සංරක්ෂණ බලපත්‍රය නිකුත් කරනු ලැබේ. මේ අනුව සංස්ථාවේ සියලුම කර්මාන්තශාලා මෙම කොන්දේසීන්ට හැකිතරම් අනුකූලවීමට උනන්දුවක් දක්වයි. වංචා හා දූෂණ සිදුවීමේ හැකියාව අඩුකිරීම සඳහා සංස්ථාව විවිධ පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරයි. මේ අනුව වැඩ තහනම් කිරීම්, දිනක වැටුප කපාහැරීම්, වාර්ෂික පඩි වැඩිවීම් අත්හිටුවීම් සහ උසස්වීම් අඩුකිරීම, වැටුප් අත්හිටුවීම සහ අලාභ අයකරගැනීම වැනි දඬුවම් වලට සේවකයන් භාජනය වේ. මෙම දඬුවම් සේවකයන් සිදුකරන ලද වංචා, දූෂණවල ස්වභාවය අනුව වෙනස්වේ.

යම් සේවකයෙකු කිසියම් හිරිහැරයකින් හෝ වෙනස්කමකින් පීඩා ලබයි නම් ඔවුන්ගේ ප්‍රධානියාට ඒ බව දැනුම් දීමට සේවකයාට අවස්ථාවක් ඇත. එවැනි අවස්ථා සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සංස්ථාවේ ප්‍රධානීන් හා ඉහළ කළමනාකාරීත්වය සක්‍රියව කටයුතු කරයි.

මේ ආකාරයට ගන්නා සෑම උපක්‍රමයකින්ම සංස්ථාවේ උන්නතිය වෙනුවෙන් යහපත්ව පාලනයන් පවත්වාගෙන යනු ලබයි. එය සංස්ථාවේ සේවකයන්ට ඇල්මැති පාර්ශවයන්ට මෙන්ම රටට ද සුභදායීවේ.


අවසාන වශයෙන් සංස්ථාපිත පාලනය තුළින් පළාත් ආයතන, රාජ්‍ය සහ සංගෘහිත විධිවිධාන හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරමින් ආයතනයේ කීර්තිනාමය වර්ධනය කෙරෙන අතරම සේවක සේව්‍ය දෙපාර්ශවයේ අනිසි හැසිරීම හේතුවෙන් උද්ගතවන අර්බුදකාරි මෙන්ම වංචාසහගත ක්‍රියාවන් අවම කෙරේ.



# තිරසාර අනාගතයක් වෙනුවෙන්

ව්‍යාපාර ආයතනයක් ආචාරධර්ම ආරක්ෂා කරමින් ආර්ථික වර්ධනය කරා අඛණ්ඩ කැපවීමෙන්, සේවකයන්ගේ සහ ඔවුන්ගේ කුටුම්භවල ජීවන තත්වය උසස් කරමින් අභ්‍යන්තර මෙන්ම බාහිර සමාජයේ උන්නතිය වෙනුවෙන් දායකවීම තිරසාර සංවර්ධනය වේ.

# තිරසාර අනාගතයක් වෙනුවෙන්




තිරසාර සංවර්ධනය නම් වූ සංකල්පය නොයෙක් ආකාරයන්ගෙන් විග්‍රහ කළ හැකිය. තිරසාර සංවර්ධනය යනු අනාගත පරපුරේ අවශ්‍යතාවයන්ට හානි නොවන පරිදි වර්තමානයේ අවශ්‍යතා සපුරා ගැනීමයි. තිරසාර ව්‍යාපාර සංවිධාන ලාභ උපයමින් පරිසර හිතකාමී ලෙස එහි නිෂ්පාදිත සහ නිෂ්පාදන ක්‍රියාවලිය සහ අනෙකුත් ක්‍රියාවලීන් වර්තමාන පාරිසරික අවශ්‍යතාවලට අනුව පවත්වාගෙන යයි. එමෙන් ම පරිසරයේ පවත්නා සම්පත් තුලින් උපරිම ඵල නෙලාගනිමින් භාණ්ඩ නිර්මාණය කරයි. වැඩිමනක් ලෙස විග්‍රහ කිරීමේදී ව්‍යාපාර ආයතනයක් ආචාරධර්ම ආරක්‍ෂා කරමින් ආර්ථික වර්ධනය කරා අඛණ්ඩ කැපවීමෙන්, සේවකයන්ගේ සහ ඔවුන්ගේ කුටුම්භවල ජීවන තත්වය උසස් කරමින් අභ්‍යන්තර මෙන්ම බාහිර සමාජයේ උන්නතිය වෙනුවෙන් දායකවීම තිරසාර සංවර්ධනය වේ.




## පාරිභෝගිකයන්

පාරිභෝගිකයන් තෘප්තිමත් කිරීමේ අරමුණින්, ''පාරිභෝගිකයා ප්‍රථම'' යන ප්‍රතිපත්තිය පාදක කොටගෙන අප සංස්ථාව රටේ ජනතාවගේ ජීවිත සාරවත් කිරීම සඳහා පාරිභෝගිකයන්ගේ විවිධ අවශ්‍යතාවයන්ට ගැලපෙන නවීන, සුරක්‍ෂිත හා ඉහළ ගුණත්වයෙන් යුත් භාණ්ඩ හා සේවා සපයනු ඇත.

පාරිභෝගික තෘප්තිය යනු ආයතනයක් සපයන භාණ්ඩ හා සේවාවන්ගෙන් පාරිභෝගිකයා තෘප්තිමත් වන ප්‍රමාණයයි. එය නැවත නැවත පැමිණෙන පාරිභෝගිකයන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ගණනය කල හැක. අප පාරිභෝගිකයන්ගෙන් බහුතර ප්‍රමාණයක් රාජ්‍ය ආයතන වන අතර, උදාහරණ ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා දුම්රිය මාර්ග දෙපාර්තමේන්තුව සහ ලංකා විදුලිබල මණ්ඩලය දැක්විය හැකිය. රාජ්‍යදැව සංස්ථාව පහත දැක්වෙන අංග, පාරිභෝගික තෘප්තියට හේතු වන බවට හඳුනාගෙන ඇති අතර, ආයතනික ඉලක්ක ළඟාකර ගැනීමට සහයෝගයෙන් යුතුව කටයුතු කරයි.

1. පාරිභෝගිකයා කේන්ද්‍ර කරගැනීම
2. නව්‍යකරණය
3. අවංකත්වය
4. ගරුත්වය
5. අඛණ්ඩ දියුණුව
6. ගුණත්වය

***රාජ්‍ය ආයතනයක් වශයෙන් රාජ්‍ය දැව සංස්ථාව පාරිභෝගිකයාට අගනා සේවාවක් ලබාදෙමින්, පාරිභෝගිකයා මූලික කොටගත් සංස්කෘතියක් නිර්මාණය කිරීමට අවශ්‍ය පරිසරයක් ගොඩනැගීම සඳහා පියවර ගෙන ඇත.***













# සේවකයන්

සේවකයන් තෘප්තිමත් කිරීමේ අරමුණින් ''ප්‍රීතිමත් සේවකයන්'' යන ප්‍රතිපත්තිය පාදක කොටගෙන අප, අපගේ සේවකයන්ට ගරු කරන අතර, සේවකයන්ගේ කාර්යසාධනය මත සංස්ථාව රඳා පවතින බවට අප විශ්වාස කරමු. ආයතනික ඉලක්ක හා පරමාර්ථ ලඟා කරගැනීම සඳහා සංස්ථාව හා සේවකයන් අතර පවතින විශ්වාසනීය බැඳීම මනා පිටුවහලක් වෙයි. අභිප්‍රේරණය වූ සේවකයන් පාරිභෝගිකයන් තෘප්තිමත්ව තබාගැනීමට විශාල ඇල්මක් දක්වයි. ආයතනයට බෙහෙවින් කැපවූ, පක්ෂපාතී සේවකයන් ස්ව කැමැත්තෙන්ම පක්ෂපාතී පාරිභෝගිකයන් රැකගැනීමටත්. ඉහළ නැංවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනී.

තාක්ෂණික කුසලතාවන්ට වඩා ආකල්ප වැඩිදියුණු කිරීම, සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව, මිත්‍රත්වය සඳහා වූ කැමැත්ත, අන්‍යන්ට සේවය කිරීම වඩා වැදගත් බව රාජ්‍ය දැව සංස්ථාව හඳුනාගෙන ඇත. මන්දයත්, සේවකයන් සතුව නිවැරදි ආකල්ප පවතී නම් ඉතා ඉක්මණින් දක්ෂතා හඳුනාගෙන ඒවාට අනුව හැඩගැසීමට කටයුතු කරන බව ප්‍රත්‍යක්ෂ වී ඇත.

රාජ්‍ය දැව සංස්ථාව එහි සංස්කෘතිය ඔවුන් විසින් ම රැකබලාගත යුතු අයුරින් සලසා ඇත. රාජ්‍ය දැව සංස්ථාව මහන්සිවී වැඩ කටයුතු කිරීම අවශ්‍ය බව සැලකුවත්, ඒ හා සමානව ප්‍රීතිමත්ව සිටීමත් අවශ්‍ය බවට විශ්වාස කරයි. රාජ්‍ය දැව සංස්ථාව තම සේවකයන්ට වැටුප් හා වේතනයන්ට අමතරව විවිධ පහසුකම් රැසක් සපයයි. උදාහරණ ලෙස, සෞඛ්‍ය රක්ෂණාවරණය, තේ සහ දිවා ආහාර දීමනා, සපත්තු දීමනාව, බස්ගාස්තු දීමනාව, සේවක ණය පහසුකම් සහ සේවක සුබසාධන පහසුකම් දැක්විය හැක. ආකල්ප පදනම් කොට ගෙන නිවැරදි සේවකයන් බඳවාගැනීම, රැකියා සඳහා අවශ්‍ය කුසලතා ඉගැන්වීම සහ ඔවුන්ට හැර යා නොහැකි පරිසරයක් නිර්මාණය කිරීම ව්‍යාපාර සාර්ථකත්වය ලඟා කරගැනීමට අනිවාර්යෙන්ම අවශ්‍ය බවට රාජ්‍ය දැව සංස්ථාව විශ්වාස කරයි.

*තාක්ෂණික කුසලතාවන්ට වඩා ආකල්ප වැඩිදියුණු කිරීම, සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව, මිත්‍රත්වය සඳහා වූ කැමැත්ත, අන්‍යන්ට සේවය කිරීම වඩා වැදගත් බව රාජ්‍ය දැව සංස්ථාව හඳුනාගෙන ඇත. මන්දයත්, සේවකයන් සතුව නිවැරදි ආකල්ප පවතී නම් ඉතා ඉක්මණින් දක්ෂතා හඳුනාගෙන ඒවාට අනුව හැඩගැසීමට කටයුතු කරන බව ප්‍රත්‍යක්ෂ වී ඇත.*



# පරිසරය සහ ප්‍රජාව

මෙහෙයුම්වලින් පරිසරයට වන බලපෑම අඩුකිරීම, දේශගුණික වෙනස්වීම් පරිවහනය කිරීම සහ ජෛව විවිධත්වය වැනි අප ව්‍යාපාර ක්‍රියාකාරකම්වලින් පරිසරයට වන බලපෑම පහළ හෙළමින් පරිසර හිතකාමී සංවර්ධනයක් රාජ්‍ය දැව සංස්ථාව අපේක්ෂා කරයි.

රටේ පවතින සංස්කෘතිය, සිරිත් විරිත්, ඉතිහාසය සහ නීති සැලකිල්ලට ගනිමින් අපි අපේ වටිනාකම් ක්‍රියාවට නංවන්නෙමු. තිරසාර සංවර්ධනය සඳහා වූ සමාජයෙන් මතුවන අවශ්‍යතා තෘප්තිමත් කළ හැකි සුරක්ෂිත, පිරිසිදු සහ උසස් තාක්ෂණයක් ඇති කිරීමට අප හැමවිටම කටයුතු කරන්නෙමු. අප කොතැනක ව්‍යාපාරය පවත්වාගෙන ගියත්, ප්‍රජාව ශක්තිමත් කිරීමට සහ සමාජයේ දියුණුවට දායකවීමට ඉවහල් වන සමාජීය ක්‍රියාකාරකම්වල සක්‍රියව නිරත වන්නෙමු.

*තිරසාර දැව අස්වනු හෙළීම වන විනාශයට හේතු නොවේ.එනම්, දැව අස්වනු හෙළීමේදී වනවගා භූමියේ නිෂ්පාදන හැකියාව ආරක්ෂා වන පරිදි ඉතා ක්‍රමවත්ව හා විද්‍යානුකූලව කටයුතු කිරීමෙන් සහ වයස්ගත ශාක වෙනුවට නව ශාක රෝපණය කොට, නව වනවගා ඇති කිරීමට කටයුතු කිරීම තුලින් පමණක් සමාජයට දිගුකාලීන ප්‍රතිලාභ සලසාගත හැකිවේ.*
















# ආයතනයක සාමාජීය වගකීම

## ආයතනයක සමාජීය වගකීම

වගකීමකින් යුතුව හැසිරීම ආයතනයක සමාජීය වගකීම ලෙස අර්ථ දැක්විය හැකිය. අප සංස්ථාව සමාජයට වගකිව යුතු පුද්ගලයෙකු ලෙස කටයුතු කිරීමට හැමවිටම උත්සාහ දරන්නෙමු. ආචාර ධර්මයන්ගෙන් සපිරි ව්‍යාපාර එහි සේවකයන්ගේ, පාරිභෝගිකයන්ගේ, ප්‍රජාවගේ සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන්ගේ ඇල්ම දියුණු කිරීමට සක්‍රිය දායකත්වය ලබාදිය යුතුය.

## වඩා හොඳ සමාජයක් බිහිකිරීමට 2014 වර්ෂය තුල අප සංස්ථාව සිදුකරන ලද ක්‍රියාකාරකම්

**1. ''ලෝක පරිසර දිනය, සමරනු වස් වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී.**

- තුරු ජන සිසු බැංකු, රුක් රෝපණ වැඩසටහන ඵලදායි ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. හඳුනාගත් පාසැල් සඳහා ද්‍රව්‍යමය හා මූල්‍යාධාර ආදිය පිරිනමන ලදී. ඉහත වැඩසටහන් තුළින් වනවගාව සඳහා තරුණ පරම්පරාවේ ඇල්ම ඉහළ නංවන ලදී. මෙමඟින් දැව කුලය පිළිබඳව පැහැදිලි අදහසක් දීමට හා එම ශාඛා පරිනතභාවයට ළඟා වූ විට නිවැරදිව උපයෝජනය කරගැනීමට මහෝපකාරි වේ.
- පරිසරය, වන සංරක්ෂණය සහ ජෛව විවිධත්වය යන මාතෘකා යටතේ පාසල් ළමුන්ට සහ දෙමාපියන්ට දේශණ පවත්වන ලදී.
- විස්තරාත්මක පොත්, දැන්වීම් සහ අත් පත්‍රිකා බෙදා දෙන ලදී.
- පාසල් සහ ගෙවතු සඳහා කළුවර ශාක වැනි ඉතා වටිනා පැළ වර්ග බෙදා දෙන ලදී.
- මින්නේරිය ජෛව විවිධත්ව උද්‍යානය විසින් සංවිධානය කරන ලද හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේ ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යන ලදී.

**2. ''දැයට සෙවන'' වැඩසටහන සඳහා ක්‍රියාකාරී දායකත්වය**

- ''දැයට සෙවන'' වැඩසටහන සඳහා අක්කර 25කින් යුක්ත මැදවච්චිය රාජ්‍ය දැව සංස්ථා භූමියේ තේක්ක පැළ 5,000ක් සිටුවන ලදී.
- බණ්ඩාරවෙල දිස්ත්‍රික්කයේ පැළ 3,000 ක් සිටුවන ලදී.
- බීජ පැළ 88,000ක් බෙදාදීම සඳහා සපයන ලදී.

**3. කැලිකසල බැහැර කිරීම කළමනාකරණය**

අප සංස්ථාව කැලිකසල, කඩදාසි, පොලිතින් සහ කාබනික අපද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කිරීමෙන් වෙන්වෙන් වශයෙන් එක්රැස් කොට ක්‍රමානුකූලව බැහැර කරනු ලබයි.

**4. කළමනාකරණ දිනපොත - 2014**

වගකීමක් සහිත වූ සංස්ථාපිත පුරවැසියෙක් වශයෙන්, අප විසින් 2014 වසරේ කළමනාකරණ දිනපොත, ''ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෙස් මුහුණු කලාව'' යන තේමාව යටතේ ගෘහභාණ්ඩවල සුන්දරත්වය, ආශ්චර්යය සහ පෞරාණික ගෘහභාණ්ඩ සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.

**5. දැයට කිරුළ - කුලියාපිටිය අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටියක් ඉදිකිරීම.**

සංස්ථාවේ ප්‍රදර්ශන කුටිය විවිධ වූ සිත් ඇදගන්නා වූ සංරචක වලින් යුක්ත වූ අතර, නරඹන්නන්ට විනෝදය පමණක්ම නොව අධ්‍යාපනික වටිනාකමක් ද, ගෙනදෙන්නක් විය. දැව සංස්ථාව විසින් දැව අස්වැන්නේ සිට අවසන් භාණ්ඩ නිෂ්පාදනය දක්වා පියවර ආකෘති මඟින් විදහා දක්වන ලදී. මෙමඟින් දැව කර්මාන්තය පිළිබඳව ජනතාව දැනුවත් කරන ලදී. ඉහත සෑම වැඩසටහනකින්ම අප අරමුණු කරන ලද්දේ දැව කර්මාන්තය පිළිබඳ මිනිසුන් තුල ඇති අසතුටුදායි වූ සමාජ ආකල්ප වෙනස් කිරීමට සහ තිරසාර පරිසර කළමනාකරණය තුලින් කර්මාන්තයේ අනාගතය දීප්තිමත් කිරීමයි.

*වගකීමකින් යුතුව හැසිරීම ආයතනයක සමාජීය වගකීම ලෙස අර්ථ දැක්විය හැකිය. අප සංස්ථාව සමාජයට වගකිව යුතු පුද්ගලයෙකු ලෙස කටයුතු කිරීමට හැමවිටම උත්සාහ දරන්නෙමු. ආචාර ධර්මයන්ගෙන් සපිරි ව්‍යාපාර එහි සේවකයන්ගේ, පාරිභෝගිකයන්ගේ, ප්‍රජාවගේ සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන්ගේ ඇල්ම දියුණු කිරීමට සක්‍රිය දායකත්වය ලබාදිය යුතුය.*

**6. උපාධි අපේක්ෂකයන් සඳහා දිවයින පුරා පුහුණු හා පර්යේෂණ අවස්ථා සපයන ලදී.**

**7. විශ්ව විද්‍යාල සිසුන් සඳහා දැව කර්මාන්තය හා දැව සැපයුම පිළිබඳ දේශණ පවත්වන ලදී.**

**8. දැව හඳුනාගැනීමේ හා සහතික කිරීමේ සේවය**

රාජ්‍ය දැව සංස්ථාවේ පර්යේෂණ අංශය වෙත දැවවල ගුණත්වය හා දැව දේපළ මත සහතික නිකුත් කිරීමේ අධිකාරි බලය 2008 පෙබරවාරි 25 වැනි දින අංකඃ1538/7 දරන විශේෂ ගැසට් පත්‍රය මඟින් පවරන ලදී. නියත බර, තෙතමනය, අන්තර්ගතය, හැකිලීම හා බෝරෝන් ප්‍රතිකාරය සඳහා දැවවල තත්වය පරීක්ෂා කිරීමට එම අංශයේ පහසුකම් ඇත.

**9. දැව තාක්ෂණ පුහුණු ආයතනය මඟින් සපයන සේවා**

රාජ්‍ය දැව සංස්ථාව ඉතා වැදගත් සන්ධිස්ථානයකට මුහුණපාමින් 2006 දී රත්මලාන කල්දෙමුල්ල දැව තාක්ෂණ පුහුණු ආයතනය පිහිටුවීමට පියවර ගන්නා ලදී. වන හා දැව තාක්ෂණය භාවිතා කරන්නන්ගේ කාර්යයන් ශක්තිමත් කිරීම තුලින් ඔවුන්ගේ ධාරිතාවය ඉහළ නැංවීමටත්, දැනුම යාවත්කාලීන කර ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන අරමුණු ඉටුකරගැනීමටත් දැව තාක්ෂණ පුහුණු ආයතනය පිහිටුවා ඇත.










# විගණකාධිපති වාර්තාව

රාජ්‍ය දැව සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන්
අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971
අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර
විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } පීඑම්/අයි/එස්ටීසී/1/15/125    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 අගෝස්තු 31 දින

17 SEP 2015

14 SEP 2015

සභාපති,

රාජ්‍ය දැව සංස්ථාව

**රාජ්‍ය දැව සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

18 SEP 2015

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

පිටපත් :- 01. ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

02. ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk





මගේ අංකය / எனது இல. / My No. } පීඑම්/අයි/එස්ටීසී/1/15/125    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 අගෝස්තු 31 දින

සභාපති

රාජ්‍ය දැව සංස්ථාව

**රාජ්‍ය දැව සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

රාජ්‍ය දැව සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනිකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ අංක 29 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපතිවරයා වෙත 2015 ජුනි 16 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණන මතය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.







## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16

i. දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී ඒවායේ ඵලදායි ජීවිත කාලය අනුව තක්සේරු කොට ක්ෂය කිරීම හා ගිණුම්ගත කිරීම සිදු කළ යුතුවේ. නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.905,640,314 ක්වූ දේපළ, පිරියත හා උපකරණ තුළ ලියා අඩුකළ අගය රු.5 බැගින් වූ පිරිවැය වටිනාකම රු.884,268,443 ක්වූ අයිතමයන් 7020 ක් හා ශුද්ධ අගය ශුන්‍ය වූ පිරිවැය රු.5,827,394 ක්වූ ස්ථාවර වත්කම්අයිතම 04 ක් විය. මෙම වත්කම් ප්‍රයෝජනයට ගත නොහැකිනම් අපහරණය කිරීමටත් තවදුරටත් ප්‍රයෝජනයට ගත හැකි නම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. සංස්ථාව විසින් ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ජීවිත කාලය සාවද්‍ය වන අතර ඒ අනුව වාර්ෂික ක්ෂය ප්‍රමාණය නිවැරදි නොවුණි.

iii. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.76,729,723 ක් වූ ඉඩම් වටිනාකම තුල රු.4,000 කට වඩා අඩු වටිනාකම් ඇති, එකතු වටිනාකම් රු.48,648 ක් වූ අයිතමයන් 33ක්ද ඇතුළත්වේ. ප්‍රමිතියට අනුව සංස්ථාවේ ඉඩම් ප්‍රත්‍යාගණනය කර නොමැති අතර අවසන් ගිණුම් තුළ දක්වා ඇති ඉඩම්වල සාධාරණ අගයයන් දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37

-----------------------------------------

වැඩ තහනම් කළ නිලධාරියෙකු වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා වලින් නිලධාරියා නිවැරදිකරු වීම නිසා රු.1,957,174 ක් හිඟ වැටුප් ලෙස ගෙවීමට සිදුවී තිබුණද එම බැරකම් සඳහා වෙන්කිරීම් හෝ හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. "වැඩ තහනමට ලක්ව සිටි නිලධාරියාගේ හිඟ වැටුප් ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කොට ඇති අතර ඒ බව කම්කරු කොමසාරිස් වෙතද දන්වා යවා ඇත. එම නිසා ප්‍රතිපාදන සැලසීම අවශ්‍ය නොවේ" යනුවෙන් 2015 ජූලි 13 දින සංස්ථාවේ සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 40

-----------------------------------------

සංස්ථාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ කොටසක් රාජ්‍ය ආයතන දෙකකට කුලියට දී සමාලෝචිත වර්ෂයේදී රු.15,042,601ක කුළී ආදායමක් උපයාගෙන තිබූ නමුත් මෙම ගොඩනැගිලේ වටිනාකම ආයෝජන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා හැකිතාක් දුරට වියදම් වර්ගීකරණය සිදු කළයුතු නමුත් එකතුව රු.3,443,573 ක්වූ වියදම් මිශ්‍ර වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.





### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ස්කන්ධ භාග මුදල සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 964,283,581 ක් වුවද ඊට අනුරූපීව වන සංරක්ෂණ දෙපාර්තමේන්තු ගිණුම අනුව සංස්ථාවෙන් ලැබිය යුතු ස්කන්ධභාග මුදල රු. 1,056,375,539 ක් විය. මේ අනුව සංස්ථා ගිණුම හා දෙපාර්තමේන්තු ගිණුම අතර රු.92,091,958 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

මහනුවර, මොණරාගල ප්‍රාදේශීය කාර්යාලවල සහ අම්පාර ගෘහ භාණ්ඩ ඒකකයට අදාළව පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ වෙළඳ ණයගැති ශේෂය රු.මිලියන 475 සිට රු. මිලියන 760 දක්වා සියයට 62 කින් ඉහල ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂයේ වෙළඳ ණයගැති ශේෂයෙන් රු. මිලියන 43 ක් වසරකට වැඩි කාලයක සිටද, රු. මිලියන 21 ක් වසර 2 ත් වසර 3 ත් අතර කාලයක සිටද, රු. මිලියන 12 ක් වසර 4 කට වැඩි කාලයක සිටද අය නොවී පැවතුණි.

(ආ) 2008 වර්ෂයේ සිට රජයේ දෙපාර්තමේන්තුවකින් අයවිය යුතු රු. 568,500 ක් හා 1983 වර්ෂයේ සිට පෞද්ගලික සමාගමකින් අය විය යුතු රු. 11,873,954 ක ණය ශේෂයන් බොල් ණය ලෙස කපාහැරීමට අපේක්ෂිත ශේෂයන් විය.

(ඇ) ප්‍රාදේශීය කාර්යාල 04 කට අයත්වූ 2013 වර්ෂයේ සිට විවිධ ණයගැතියන්ගෙන් අයවිය යුතු රු.3,828,645 ක් වූ ණය ශේෂ තවදුරටත් අය නොවී පැවතුණි.

(ඈ) දැව හා දැවමය නිෂ්පාදිත සැපයුම්කරුවන්ට අවසාන ගෙවීම් කිරීමේදී ලබාදී ඇති අත්තිකාරම් මුදල් අඩුකර නොගැනීම හෝ භාණ්ඩ නොසැපයීම නිසා හෝ වසර 01 ත් වසර 05 ක් දක්වා වූ කාලයක සිට රු.3,692,862 ක මුදලක් අයවිය යුතු ව පැවතුණි.

(ඉ) පොදු තැන්පත් ශේෂය යටතේ ප්‍රාදේශික **4** කට අදාළව සංස්ථාවට අයවිය යුතු රු. 3,330,933 ක ශේෂයන් තවදුරටත් අය නොවී පැවතුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව වෙත ලැබුණු රු.110,552 ක්වූ චෙක්පතක් අවලංගු වී තිබුණු අතර තව දුරටත් එම මුදල අය විය යුතුව පැවතුණි.

(උ) පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය වෙනුවෙන් දැව සංස්ථාව විසින් ඉකුත් වසරේදී වැය කර තිබූ රු.1,860,952 ක මුදලක් මෙතෙක් අයවී නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබූ රු.128,298,983 ක්වූ ණයහිමි ශේෂය සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබූ බැවින් ණයහිමි ශේෂයන්ගේ හිඟහිටි කාලසීමාව කොපමණද යන්න අනාවරණය නොවුණි.

(එ) අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයෙහි විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබූ රු.52,155,675 ක්වූ ස්කන්ධභාග මුදල මෙතෙක් පියවා නොතිබුණි.

(ඒ) එකතුව රු. 19,278,900 ක් වූ ලංසු තැන්පතු, බැඳුම්කර තැන්පතු සහ වන අපරාධ තැන්පතුවලට අදාළව තවදුරටත් වගකීමක් නොමැති තැන්පත් ප්‍රමාණය ගණනය කර ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) ගැන්ග් නේල් ලබාගැනීමට සැපයුම්කරුවන් විසින් තබා ඇති වසර 2 ඉක්මවන ලද රු.2,855,000 ක්වූ තැන්පතු මුදල් නිරවුල් කර නොතිබුණි.





**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1980 අංක 46 දරන සේවා නියුක්තින්ගේ භාර අරමුදල් පනත | පනත අනුව වැටුප්/ වේතන ගෙවනු ලබන මාසයට පසුව එළඹෙන ඊලග මාසය අවසන් වීමට පෙර දායක මුදල් අරමුදල වෙත ප්‍රේෂණය කළයුතු වුවද, නියමිත කාලසීමාව තුළ දායක මුදල් ප්‍රේෂණය නොකිරීමේ හේතුව මත රු. 95,714 ක මුදලක් දඩ වශයෙන් ගෙවා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | (i) ආයතන සංග්‍රහයේ I කොටස | වෘත්තීය සමිති කටයුතු සඳහා සංස්ථාවේ වාහන වෙන්කර දීමට ආයතන සංග්‍රහයේ විධි විධාන සලසා නොමැති වුවද, වෘත්තීය සංගමයකට 2013 වර්ෂයේ සිට වාහනයක් ලබාදී තිබුණි. එම වාහනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.87,120 ක මුදලක් ඉන්ධන සඳහා වැයකර තිබුණි. |
| | (ii) ආයතන සංග්‍රහයේ I කොටසෙහි XXV පරිච්ඡේදයේ 4 වගන්තිය | ඉහත වෘත්තීය සංගමයේ සාමාජික සංඛ්‍යාව 1600 ඉක්මවන බැවින් එක් නිලධාරියෙකු වෘත්තීය සමිති කටයුතු සඳහා පූර්ණ කාලීනව නිදහස් කරවා ගැනීමට හැකියාව තිබියදීත්, එවැනි නිදහස් කරවා ගැනීමකින් තොරව වෘත්තීය සමිතියේ සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයේදී දින 275 ක් මෙම වාහනය වෘත්තීය සමිති කටයුතු සඳහා යොදවාගෙන තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2009 මැයි 26 දිනැති අංක DMS/A/8/27 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 39 | බඳවා ගැනීම් පරිපාටියේ සඳහන්ව නොමැති සහ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව වැටුප් වර්ධක අනුමත කර දැව සංස්ථා නිලධාරීන් 14 දෙනෙකුට රු.448,110 ක මුදලක් සහ තවත් නිලධාරීන් දෙදෙනෙකුට රු.382,200 ක මුදලක් 2013 ජනවාරි සිට 2014 ජුනි දක්වා වැටුප් වර්ධක ලෙස ගෙවා තිබුණි.<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම මුදල් ආපසු අයකරගත යුතු බව දන්වා තිබුණු අතරම 2015 මාර්තු 26 දින පැවති අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේදීද මෙම මුදල් අයකරගත යුතු බවට තීරණය කර තිබුණි. එසේ වුවත් එම තීරණයට අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | |
| (i) 2.8.4 වගන්තිය | විශාල වටිනාකම් සහිත තාක්ෂණික උපකරණ මිලදී ගැනීමේදී ඒ පිළිබඳ විශේෂඥ දැනුම ඇති බාහිර පුද්ගලයෙකු රේඛීය අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර ප්‍රසම්පාදන විෂයය සම්බන්ධයෙන් දැනුම ඇති අයෙකුවත් සිටිය යුතු වුවද, සංස්ථාව විසින් එවැනි පුද්ගලයෙකු ප්‍රසම්පාදන කමිටුව සඳහා පත්කර නොතිබුණි. |
| (ii) 4.2.3 වගන්තිය | වගන්තිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලැබී සති 04ක කාලයක් තුළ භාණ්ඩ මිලදී ගතයුතු වුවද. PEZZALATO පටි ඉරුම් යන්ත්‍රයට අමතර කොටස් මිලදී ගැනීමේදී එයට පටහැනිව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලැබීමෙන් පසුව මාස 05 ක් සහ දින 24 ක කාලයක් ප්‍රමාද කර මෙම භාණ්ඩ මිලදී ගෙන තිබුණි. |





## 3. මූල්‍යසමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයයේදී සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය ආදායම් බදු ගණනය කිරීමට පෙර රු.402,222,441 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම් බදු ගණනය කිරීමට පෙර ශුද්ධ ලාභය රු.332,336,761 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.69,885,680 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයට ගෙවන ලද දායක මුදල පෙර වර්ෂයට වඩා රු. මිලියන 25කින් අඩු වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 මූල්‍ය ප්‍රතිඵලයේ වෙනස්වීම් පිළිබඳ විශ්ලේෂණය

(අ) සංස්ථාවේ මූලික මෙහෙයුම් වලින් රු.1,453,450,911 ක ලාභයක් උපයා තිබූ අතර මෙය ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ලාභය වූ රු.1,197,615,198 ක් හා සැසඳීමේදී රු.255,835,713 ක වැඩිවීමකි.

(ආ) සමාලෝචිත වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.427,222,441 ක් තුළ රු. 222,826,051 ක් වූ මෙහෙයුම් නොවන ආදායම් ඇතුළත් වූ අතර එය බදු පෙර ශුද්ධ ලාභයෙන් සියයට 52ක් තරම් විශාල අගයක් ගෙන තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ ලාභයෙහි සියයට 11.74 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් හෝ ආරම්භකර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් කම්කරු විනිශ්චය සභා නඩු 04 ක්ද, මහේස්ත්‍රාත් අධිකරණ නඩු 02 ක්ද, දිසා අධිකරණ නඩු 07 ක්ද, මහාධිකරණ නඩු 02 ක්ද, අභියාචනාධිකරණ නඩු 03 ක් සහ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු 02 ක් ද ඇතුළුව නඩු 20 ක් ඉදිරිපත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාව විසින් මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පවරන ලද එක් නඩුවක්ද විභාග වෙමින් තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ඉරූ දැව අලෙවිය**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, සංස්ථාව විසින් ඉරූ දැව අලෙවියෙන් රු.මිලියන 337 ක ආදායමක් ඉපයීමට සැලසුම්කර තිබු නමුත් තථ්‍ය අලෙවි ආදායම රු.මිලියන 156 ක් හෙවත් සැලසුම් ආදායමෙන් සියයට 46 ක් පමණක් විය. ඉරූ දැව වෙළඳ පොළෙහි පවත්නා තරගකාරී මිළ ගණන් සමහ රාජ්‍ය දැව සංස්ථාවට කටයුතු කළ නොහැකිවීමත්, වෙළඳ පොළ අධ්‍යයනයක් සිදුකර අලෙවිය වැඩිකර ගැනීමේ වෙළඳ උපක්‍රම අනුගමනය නොකිරීමත් මෙම තත්ත්වයට හේතු වී තිබුණි.

**(ආ) ගෘහ භාණ්ඩ අංශයේ කාර්යසාධනය**

(i) බූස්ස ඉරුම්හලෙහි රු. 6,190,950 ක් වැයකර 2013 මැයි මස ස්ථාපිත කර තිබුණු Finger Joint යන්ත්‍රයෙහි නිෂ්පාදිත ගෘහ භාණ්ඩ අලෙවියෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. 648,141 ක ලාභයක් පමණක් උපයාගෙන තිබුණි. යන්ත්‍රය ස්ථාපිත දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා සැලකිය යුතු ලාභයක් ඉපයීමට අපොහොසත් වී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂයේදී කල්දෙමුල්ල ගෘහ භාණ්ඩ නිෂ්පාදන සංකීර්ණයෙන් රු.17,626,742 ක අලාභයක් ලබා තිබුණි. නිෂ්පාදන පිරිවැය අවම කර නොගැනීම මෙම අලාභයට ප්‍රධාන හේතුව වී තිබුණි.

**(ඇ) නිෂ්පාදන කටයුතු වල ප්‍රගතිය**

සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන දැව හා දැවමය භාණ්ඩ නිෂ්පාදනයන්හි පසුගිය වර්ෂ කිහිපයකට අදාළ තත්ත්වයන් පහත දැක්වේ.

(i) 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉරූ දැව නිෂ්පාදනයෙහි සියයට 42 ක අඩුවීමක් නිරීක්ෂණය විය.



AGDSL
විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

(ii) 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විදුලි සම්ප්‍රේෂණ කණු සහ සිල්පර නිෂ්පාදනයෙහි අඩු වීම පිළිවෙලින් සියයට 62.73 ක් සහ සියයට 76 ක් විය. 2010 වර්ෂයෙන් පසු සමාලෝචිත වර්ෂය දක්වා නිෂ්පාදනයෙහි අඛණ්ඩ පිරිහීමක් නිරීක්ෂණය විය.

(iii) ගෘහ භාණ්ඩ නිෂ්පාදන අංශය දිගින් දිගටම අලාභ ලබා තිබුණි. ගෘහ භාණ්ඩ නිෂ්පාදන පිරිවැය අධික වීම හේතුවෙන් ගෘහ භාණ්ඩ මිල අධික වීම නිසා අලෙවි ආදායම අඩුවීම අලාභ ලැබීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 4.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැඩබිම්වල ගස් හෙළීම සඳහා සංස්ථාව සමග කොන්ත්‍රාත්කරුවන් ගිවිසුම් ගතවූ අවස්ථාවේ සිට වැඩබිමෙහි වැඩ අවසන් වනතෙක් කොන්ත්‍රාත්කරුවන් විසින් ගිවිසුම් ගත වටිනාකමෙන් සියයට 10 ක මුදලක් ඇපකරයක් මගින් සංස්ථාවට උකස්කර පවරා දීමට බැඳී සිටින නමුත්, එක් කොන්ත්‍රාත්කරුවෙකු විසින් කොන්ත්‍රාත් කිහිපයක් කරනු ලබන අවස්ථාවලදී එක් කොන්ත්‍රාත්තුවක් නිම වීමට ප්‍රථම එකම ඇපකරය වෙනත් කොන්ත්‍රාත්තුවක් සඳහාද තබා ඇති බව නිරීක්ෂණය විය.

(ආ) පොළොන්නරුව කළු උල්පත් වැව වැඩබිමෙහි දැව සැපයීම 2013 ජුලි 05 දින සිට කෙටිවැඩ ගිවිසුම් මගින් පවරා දී තිබුණු අතර නියමිත කාල සීමාව තුල වැඩ අවසන් කර නොතිබීම වෙනුවෙන් ප්‍රමාද දඩ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා පුවත්පත් දැන්වීමක් මගින් මිල ගණන් කැඳවන ලද බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණු නමුත්, මේ සඳහා ආයතන හයක් (06) ක් විසින් මිල ගණන් ඉදිරිපත් කළ බවට විස්තර විගණනයට ඉදිරිපත් කෙරුණි. එයින් තුන්වන පහළම මිල ඉදිරිපත් කළ ආයතනය තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන් මත තෝරා ගෙන තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව නියමිත කාලය තුළ අවසන් නොකිරීම නිසා දින 153 ක් සඳහා ප්‍රමාද දඩ රු. 138,713 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම කොන්ත්‍රාත්තුවේ මුලික ඇස්තමේන්තුවට අනුව පස් කියුබ් 623 ක් සැපයීමට ගිවිස ගෙන තිබුණද එයින් පස් කියුබ් 300 ක් සැපයීම වෙනුවෙන් රු.645,000 ක මුදලක් ගෙවා තිබුණි. එසේ වුවත් පසුව

පස් කියුබ් 1300 ක් සැපයීමට මුලික ඇස්තමේන්තුවද ඉක්මවා රු. 4,593,800 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර ටෙන්ඩර් මණ්ඩල අනුමැතියකින් තොරව පස් කියුබ් 513 ක් අතිරේකව සැපයීම වෙනුවෙන්ද රු.546,345 ක මුදලක් ගෙවා තිබුණි.

**4.3 හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවීම් සිදු කිරීමේදී රඳවාගෙන ඇති මුදල් වෙනුවෙන්ද එකතු කළ අගය මත බදු (VAT) ලෙස රු. 597,718 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) හිටපු සභාපතිවරයාගේ පරිහරණය සඳහා සංස්ථාව විසින් නිකුත් කර තිබුණු Laptop පරිගණකයක්, පරිගණක උපාංග, සැම්සුන් ජංගම දුරකථනයක් (Samsung Mobile Phone Tabular) සහ දුරදක්නයක් සංස්ථාවට නැවත භාරදී නොතිබුණි.

**4.4 මානව සම්පත් කළමනාකරණය**

සංස්ථාවේ නිලධාරීන් ඉදිරිපත් කර තිබුණු ඉදිරි වැඩසටහන් පරීක්ෂාවේදී අදාල ඉදිරි වැඩ සටහන් ඉදිරිපත් කිරීම, අනුමත කිරීම හා වැඩසටහන්වලට අනුව රාජකාරියෙහි නිරතවීම යන කරුණු සම්බන්ධ පාලනය ඉතා දුර්වල මට්ටමක පැවති බව අනාවරණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

සංස්ථාව විසින් 2013-2017 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබු නමුත් 2003 ජුනි 02 දිනැති අංක PED /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1.1 වගන්තිය ප්‍රකාරව සංයුක්ත සැලැස්ම කාලානුරූපිව සමාලෝචනය කර යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.







**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංයුක්ත සැලැස්මෙහි සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් මුලික වශයෙන් වැඩසටහන් 17 ක් යටතේ වර්ග කර දක්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබු ක්‍රියාකාරී සැලැස්මෙහි ඒ යටතේ කිසිදු ප්‍රාග්ධන වියදම් වැඩ සටහනක් පෙන්වා නොතිබු අතර, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු අයවැය ඇස්තමේන්තුවෙහි දක්වා තිබු රු.286,440,500 ක්වූ ව්‍යාපෘතීන් සංයුක්ත සැලැස්මෙහි වූ රු. 423,000,000 ක්වූ ව්‍යාපෘතීන් සමග අනුකූල නොවිනි. ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික ඇස්තමේන්තු, සංයුක්ත සැලැස්ම පාදක කරගනිමින් පිළියෙල කර නොතිබුණි.

(ආ) සංස්ථාවේ සියළු අංශ එනම් මානව සම්පත්, තොරතුරු හා තාක්ෂණ, පර්යේෂණ, සංවර්ධන හා පුහුණු යනාදී අංශ ආවරණය වනසේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබු ප්‍රසම්පාදන සැලැස්මෙහි කඳන් අලෙවිය (කොන්ත්‍රාත්) සහ අයවැය ලේඛනයේ කඳන් අලෙවිය (කොන්ත්‍රාත්) අතර රු. 59,480,500 ක වෙනසක් නිරීක්ෂණය විය.

**5.4 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

1999 නොවැම්බර් 19 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය, 2000 මාර්තු 30 දිනැති බීඩී/පීඊ චක්‍රලේඛ අංක 02/2000 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය මගින් හා 2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින්ද පැහැදිලිව අවධාරණය කර ඇති පරිදී බාහිර විගණක විසින් ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් සම්බන්ධයෙන් විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡා කළයුතු වුවද, 2014 සැප්තැම්බර් 30 දිනෙන් පසුව පවත්වන ලද විගණන කමිටු රැස්වීම් න්‍යාය පත්‍රයට බාහිර විගණන වාර්තා/විගණන විමසුම් සාකච්ඡා කිරීම ඇතුළත් කර නොතිබුණි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
தலைமை கணக்காய்வாளர் திணைக்களம்
Auditor General's Department

5.5 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුව පිළියෙල කර නොතිබුණි.

(ආ) අයවැය සහ තථ්‍ය ආදායම් සහ වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.6 නොවිසඳී ඇති විගණන ඡේද

බංගලාවත්ත වැපල්ටන් වාණිජ තුනී කිරීම් බිම් කට්ටියේ අනවසර ගස් හෙළීම් සිදුකිරීමට එරෙහිව කොන්ත්‍රාත්කරු සහ සංස්ථා නිලධාරීන් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියා මාර්ග ගන්නා බව සංස්ථාවේ සභාපතිවරයා 2013 ජූනි 28 දින දන්වා සිටියද 2015 මැයි 20 දින වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) ණයගැති පාලනය
(ඇ) ණය හිමි පාලනය
(ඈ) අයවැය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය
(උ) සේවක මණ්ඩල පරිපාලනය
(ඌ) ප්‍රසම්පාදනය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

14





# විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| පිරිවැටුම | 2 | 3,473,847,448 | 2,893,748,677 |
| විකුණුම් පිරිවැය | 3 | (2,020,396,537) | (1,696,133,479) |
| **මෙහෙයුම් මත දළ ලාභය** | | **1,453,450,911** | **1,197,615,198** |
| වෙනත් ආදායම් | 6 | | |
| මෙහෙයුම් | 6.2 | 59,808,848 | 61,498,711 |
| මෙහෙයුම් නොවන | 6.1 | 222,826,051 | 258,397,070 |
| **මුළු ශුද්ධ ආදායම** | | **1,736,085,810** | **1,517,510,979** |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | 4 | (551,768,665) | (483,373,537) |
| පරිපාලන වියදම් | 5 | (757,094,704) | (651,800,681) |
| **භාණ්ඩාගාර බදුවලට පෙර ශුද්ධ ලාභය** | | **427,222,441** | **382,336,761** |
| භාණ්ඩාගාරයට ගෙවූ බදු | | (25,000,000) | (50,000,000) |
| **භාණ්ඩාගාර බදුවලට පසු ලාභය** | | **402,222,441** | **332,336,761** |
| වර්ෂය සඳහා ආදායම් බදු | 7 | (196,224,578) | (150,222,702) |
| **ආදායම් බදුවලට පසු ලාභය** | | **205,997,863** | **182,114,059** |
| වෙනත් විස්තීරණ ආදායම් | | - | - |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | | 205,997,863 | 182,114,059 |



# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 905,640,314 | 906,902,528 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 1,634,835 | 2,237,142 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 10 | 4,836,929 | 3,184,890 |
| භාණ්ඩාගාර තැන්පත් | | 2,966,000 | 2,966,000 |
| සේවක ඇප තැන්පත් | | 48,717,776 | 44,231,056 |
| ආයෝජන | 11.1 | 491,211,954 | 567,085,340 |
| පෙර ගෙවුම් සේවක ප්‍රතිලාභ | | 43,149,305 | 46,927,158 |
| විලම්භිත බදු වත්කම් | 7.2 | 41,757,543 | 33,396,804 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | | 114,993,567 | 51,603,590 |
| මුළු ජංගම නොවන වත්කම් | | 1,654,908,222 | 1,658,534,509 |
| **ජංගම වත්කම්** | | | |
| වෙළඳ තොග | 12 | 1,068,260,904 | 988,883,042 |
| වෙළඳ සහ වෙනත් ණයගැතියෝ | 13 | 1,050,972,162 | 890,708,037 |
| ස්ථිර තැන්පතුවල ආයෝජන | 11.2 | 1,574,321,125 | 1,203,491,399 |
| මුදල් හා බැංකු ශේෂය | 14 | 311,305,958 | 70,694,647 |
| මුළු ජංගම වත්කම් | | 4,004,860,149 | 3,153,777,126 |
| **මුළු වත්කම්** | | **5,659,768,371** | **4,812,311,635** |
| **ස්කන්ධය හා බැරකම්** | | | |
| **ස්කන්ධය හා සංචිත** | | | |
| අනුමත ප්‍රාග්ධනය | | 75,000,000 | 75,000,000 |
| දායක ප්‍රාග්ධනය | 15 | 41,503,668 | 41,503,668 |
| අයභාර සංචිත | | 3,311,070,807 | 3,110,175,859 |
| | | 3,352,574,475 | 3,151,679,527 |
| සේවක ණය චක්‍රීය අරමුදල | 16 | 230,554,340 | 225,543,133 |
| මුළු ස්කන්ධය | | 3,583,128,815 | 3,377,222,660 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදල | 17 | 435,931,143 | 340,599,947 |
| සේවක ඇප තැන්පත් | | 48,717,776 | 44,231,056 |
| මුළු ජංගම නොවන බැරකම් | | 484,648,919 | 384,831,003 |
| **ජංගම බැරකම්** | | | |
| ආදායම් බදු | 18 | 232,193,834 | 88,581,787 |
| ණයහිමියෝ සහ උපචිත වියදම් | 19 | 1,359,796,803 | 961,676,185 |
| මුළු ජංගම බැරකම් | | 1,591,990,637 | 1,050,257,972 |
| මුළු බැරකම් | | 2,076,639,556 | 1,435,088,975 |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | **5,659,768,371** | **4,812,311,635** |

රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරකම් සම්බන්ධ මෙම ප්‍රකාශනය 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන වලට අනුකූලව ඉදිරිපත් කරනු ලැබේ.

සාමාන්‍යාධිකාරි
රාජ්‍ය දැව සංස්ථාව

පිටු අංක 85 සිට 91 දක්වා වන ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 92 සිට 101 දක්වා වන ගිණුම් සටහන් මෙම ගිණුම් ප්‍රකාශන වල කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්‍ෂ මණ්ඩලය සතුවේ. අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

සභාපති
රාජ්‍ය දැව සංස්ථාව.
අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන්.

අධ්‍යක්‍ෂ

දිනයඃ- 2015.07.20



# ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

| | දායක ප්‍රාග්ධනය රු. | සේවක ණය චක්‍රීය අරමුදල රු. | රඳවාගත් ලාභ රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| 2013 ජනවාරි 01 වන දිනට ශේෂය | 41,503,668 | 218,784,628 | 2,935,644,568 | 3,195,932,864 |
| වර්ෂය තුල කරන ලද ගැලපුම් | - | (824,263) | - | (824,263) |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | - | 182,114,059 | 182,114,059 |
| වර්ෂය සඳහා සේවක ණය පොළිය | - | 7,582,768 | (7,582,768) | - |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 41,503,668 | 225,543,133 | 3,110,175,859 | 3,377,222,660 |
| වර්ෂය තුල කරන ලද ගැලපුම් | - | (91,708) | - | (91,708) |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | - | 205,997,863 | 205,997,863 |
| වර්ෂය සඳහා සේවක ණය පොළිය | - | 5,102,915 | (5,102,915) | - |
| 2014 දෙසැම්බර් 31 වන දිනට ශේෂය | 41,503,668 | 230,554,340 | 3,311,070,807 | 3,583,128,815 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු මුදල් | 3,114,095,334 | 3,100,220,273 |
| සැපයුම්කරුවන්ට හා සේවකයින්ට ගෙවූ මුදල් | (2,679,852,677) | (2,692,082,754) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් | 434,242,657 | 408,137,519 |
| ආදායම් බදු | (60,973,270) | (13,827,187) |
| භාණ්ඩාගාරයට ගෙවූ විශේෂ බදු | (25,000,000) | (50,000,000) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 348,269,387 | 344,310,332 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් මිලදීගැනීම් | (113,479,867) | (329,685,077) |
| ජීව විද්‍යාත්මක වත්කම් සංවර්ධනය | (1,652,039) | (3,184,890) |
| ආයෝජන | (294,956,339) | (385,399,827) |
| ආයෝජන වලින් ලද ආදායම | 353,965,156 | 247,383,991 |
| වත්කම් විකිණීමෙන් ලද මුදල් | 6,843,786 | 9,112,038 |
| කෙරීගෙන යනවැඩ | (63,389,977) | 52,917,833 |
| සේවක ණය චක්‍රීය අරමුදල | 5,011,207 | 9,707,359 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (107,658,075) | (399,148,574) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | - | - |
| මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ අගය වැඩිවීම | 240,611,311 | (54,838,242) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් - සටහන 14 | 70,694,647 | 125,532,889 |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන වත්කම් - සටහන 14 | 311,305,958 | 70,694,647 |



# ගිණුම් සඳහා සටහන්

## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## 01. ගිණුම්කරණ ප්‍රතිපත්ති.

### 1.1 වාර්තාකරණ ආයතනය

### 1.1.1 සංස්ථාපනය

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ, 1968, අප්‍රේල් මාසයේ දී රාජ්‍ය දැව සංස්ථාව සංස්ථාවක් ලෙස ස්ථාපනය කරන ලදි.

### 1.1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය ලද දිනය

2015, ජූලි මස 20 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ දී සම්මත කරගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුකූලව 2014 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

### 1.1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා නිකුත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.

### 1.1.4 සේවක සංඛ්‍යාව.

2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 2,186 කි. (2013 වර්ෂයේ 2,139 කි)

### 1.2 ඉදිරිපත් කිරීමේ පදනම

### 1.2.1. අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් ප්‍රකාශ කරන ලද නිර්දේශිත රීතීන් වලට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත) වලට අනුකූලව සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට හා එම කාලපරිච්ඡේදයෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමග ගිණුම් සඳහා සටහන් පිළියෙල කර ඇත.

### 1.2.2 අගය කිරීමේ පදනම

ලැබිය යුතු සේවක ණය සාධාරණ අගයට ගිණුම්වල පෙන්වා ඇති අතර, ඒ හැර අනෙකුත් අගයන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම් කරගෙනය.

### 1.2.3 භාවිතා වන හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සංස්ථාවේ ගනුදෙනු කරන මුදල් ඒකකය වේ. විශේෂයෙන් සඳහන් කොට නොමැති නම්, සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියල දක්වා වටයා ඉදිරිපත් කර ඇත.

### 1.2.4 ඇස්තමේන්තු හා නිගමන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වයට

නොයෙකුත් ඇස්තමේන්තු, නිගමන හා උපකල්පන පදනම් කරගැනීමට සිදුවන අතර, ඒවා ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී හා වාර්තා කරන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල අගයන් කෙරෙහි බලපෑම් ඇති කරවයි. ඇස්තමේන්තු සහ මූලික උපකල්පන අතීත අත්දැකීම් සහ යම් අවස්ථාවන් යටතේ සාධාරණයැයි විශ්වාස කරන විවිධ වෙනත් කරුණු මත පදනම් වී ඇත. සත්‍ය ප්‍රතිඵලය, ඇස්තමේන්තු නිගමනයන් හා තීරණවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු හා උපකල්පන නිරතුරුවම සමාලෝචනය කරනු ලැබේ. සංශෝධනය කරනු ලබන ගණකාධිකරණ ඇස්තමේන්තු එම ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට හා ඒවා බලපානු ලබන ඉදිරි කාලපරිච්ඡේද සඳහා ගලපනු ලැබේ.

### 1.2.5 විදේශ විනිමය ගනුදෙනු

විදේශ විනිමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනුයේ ගනුදෙනු සිදුවූ දිනට පැවති විනිමය වටිනාකම අනුව වේ.

### 1.2.6 බදුකරණය

ගිණුම් ප්‍රකාශවල වාර්තා වන ආදායම් සහ වියදම් පදනම් කරගෙන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ පසුකාලීන සංශෝධන වලට අනුකූලව ගණනය කිරීමෙන් පසුව ආදායම් බදු සඳහා වෙන්කිරීම් කර ඇත.

## 1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාල ගිණුම් කාලපරිච්ඡේදය තුලදී අඛණ්ඩව භාවිතා කොට ඇත.

### 1.3.1 වත්කම් සහ වටිනාකම ගණනය කිරීම

### 1.3.1.1 දේපල පිරියත හා උපකරණ

#### 1.3.1.1.1 හඳුනාගැනීමේ පදනම

දේපල, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවූ වටිනාකම අඩුකර අගය කර ඇත. (ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සාධාරණ අගය මත) වත්කම මිලදී ගැනීමේදී එය ඍජුව ආරෝපිත වියදම් දේපල, පිරියත හා උපකරණ පිරිවැයට ඇතුළත්වේ. දේපල, පිරියත හා උපකරණවල වෙනස් කොටස්වල විවිධ ඵලදායී ජීවකාල ඇත්නම් ඒවා දේපල, පිරියත හා උපකරණවල වෙනම අයිතම ලෙස ගිණුම්ගත කරයි. සියලු දේපල, පිරියත හා උපකරණ පළමුව පිරිවැයට හඳුනාග නී. ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ අගය සහ ඉදිරියට ගෙනඑන ලද අගය අතර සැලකියයුතු වෙනසක් ඇත්නම් ඒවා වෘත්තිය සුදුසුකම්ලත් තක්සේරුකරුවන් විසින් ප්‍රත්‍යාගණනය කරනු ලබයි. දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරන විට මුළු වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ප්‍රත්‍යාගණනයෙන් වැඩිවන වත්කම්වල ඉදිරියට ගෙනඑන ලද වටිනාකම ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කරනු ලැබේ.

වත්කම් ප්‍රත්‍යාගණනය නිසා උද්ගත වන වටිනාකම් අඩුවීම් එම වත්කමේ පෙර අවස්ථාවකදී කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය නිසා උද්ගත වූ වටිනාකම් වැඩිවීම ඇතුළත් ප්‍රත්‍යාගණන සංචිතයට හිලව්කරනු ලැබේ. අනෙක් සෑම වටිනාකම් අඩුවීමක් ම විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ගැලපීම් කරනු ලැබේ.

#### 1.3.1.1.2 වත්කම් විකිණීමෙන් ඇති වූ ලාභ/අලාභ

වත්කම් විකිණීමෙන් ඇති වන ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ විකිණීමේදී ලැබීම් හා වත්කමේ ධාරණ වටිනාකමේ වෙනස ලෙස ගණනය කරන ලද) වත්කම විකුණනු ලබන වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම්/වියදම් යටතේ දක්වනු ලබයි.



#### 1.3.1.1.3 පසු පිරිවැය

ස්ථාවර ස්වභාවයෙන් ව්‍යාපාරය පවත්ගෙන යාමට හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාව වර්ධනය කිරීම සඳහා වත්කම් පවරාගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා වැයවන පසු වියදම්, ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබන අතර, එවැනි වියදම් වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකමෙන් හඳුනාගැනේ. එමෙන්ම දේපල හා උපකරණවල එදිනෙදා නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශනයෙන් යෙදවූ වටිනාකම් ලෙස හඳුනාගැනේ.

#### 1.3.1.1.4 ඉවත් කිරීම්

දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී හෝ ඒවා පාවිච්චි කිරීම තුළින් ඉදිරි ප්‍රතිලාභයක් අත්නොවන විට ඒවායේ ඉදිරියට ගෙනඑන ලද වටිනාකම ගිණුම් වලින් ඉවත් කරනු ලැබේ. මෙසේ වත්කම් ඉවත් කිරීමේදී උද්ගත වන ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ගලපනු ලබන අතර, ලාභ ආදායමක් ලෙස සලකනු නොලැබේ.

#### 1.3.1.1.5 ක්ෂයවීම

දේපල, පිරියත හා උපකරණවල සියලුම අංගයන් එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා සරල රේඛීය පදනම මත විස්තීරණ ආදායම් ප්‍රකාශනයට කපාහරිනු ලබයි. ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර, අදාල ක්ෂය කිරීම් අනුපාත පහත පරිදි වේ.

| | |
|---|---|
| ස්ථිර ගොඩනැගිලි | 2.5% |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 30% |
| යන්ත්‍රෝපකරණ | 10% |
| වාහන | 20% |
| මාර්ග හා දුම්රිය මාර්ග | 5% |
| බදු ඉඩම් | 5% |
| මාර්ග ඉදිකිරීම් | 10% |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| විවිධ වත්කම් | 20% |
| පරිගණක | 20% |

### 1.3.1.2 නොනිමි වැඩ

ගිණුම් වර්ෂය තුලදී සම්පූර්ණ කරගත නොහැකි වූ ප්‍රාග්ධන ආයෝජනවලට අදාල ප්‍රාග්ධන වියදම් අදාල වර්ෂයේ නොනිමි වැඩ යටතේ දක්වා ඇති අතර, වැඩ සම්පූර්ණ වී පරිහරණයට සුදුසු තත්වයට පැමිණි පසු ඒවා දේපල පිරියත හා උපකරණ යටතේ දක්වනු ලැබේ.

### 1.3.1.3 අස්පෘෂ්‍ය වත්කම්

අස්පෘෂ්‍ය වත්කම්වලට පරිඝනක මෘදුකාංග මිලදිගැනීම සඳහා වැය වූ පිරිවැය ඇතුලත් වේ. එමෙන්ම මෙවැනි අස්පෘෂ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එහි පිරිවැය විශ්වාසදායි ලෙස මැනිය හැකිනම් සහ එහි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ලැබීමේ ප්‍රවණතාවයක් පවතී නම් පමණි. අස්පෘෂ්‍ය වත්කම් පිරිවැයෙන්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි වූ වටිනාකම් අඩුකර වටිනාකම අගය කර ඇත. විශේෂිත වත්කමකට අදාලව පසුව දරනු ලබන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එම වියදම් දැරීම හේතුවෙන් අදාල වත්කමෙහි අනාගත ආර්ථික ප්‍රතිලාභ වර්ධනයට එය පිටුවහලක් වන්නේ නම් පමණි. ක්‍රමක්ෂය සරල රේඛීය පදනම මත ඇස්තමේන්තු ගත පස් අවුරුදු ජීව කාලය පුරා කපාහරිනු ලබයි.

### 1.3.1.4 ජීව විද්‍යාත්මක වත්කම්

''ජීව විද්‍යාත්මක වත්කම්'' පරිණත ජීව විද්‍යාත්මක වත්කම් සහ අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස

වර්ගීකරණය කර ඇත. පරිණත ජීව විද්‍යාත්මක වත්කම් ගණයට අයත් වන්නේ ඵලදාව නෙලාගන්නා මට්ටමට පත්ව ඇති හෝ නිරන්තර ඵලදාව ලැබෙන තත්වයට පත්ව ඇති අයිතමයන් ය. අපරිණත ජීව විද්‍යාත්මක වත්කම් ලෙස සැලකෙන්නේ ඵලදාව නෙලාගන්නා තත්වයට පත් නොවූ අයිතමයන්ය.

ජීව විද්‍යාත්මක වත්කම් ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් සහ පරිභෝජනමය ජීව විද්‍යාත්මක වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර ඵලදරන ජීව විද්‍යාත්මක වත්කම් විකිණීම සඳහා හෝ නෙලා ගැනීම සඳහා තබා නොගන්නා ඒවා වන අතර, එම අයිතමයන් කෘෂිකාර්මික නිෂ්පාදනයන් ලබා ගැනීමේ පරමාර්ථයෙන් සංවර්ධනය කරනු ලැබේ. පරිභෝජනමය ජීව විද්‍යාත්මක වත්කම් ගණයට දැව ලබාගැනීමට පාලනය කරනු ලබන ගස් මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වලින් ඵලදාව නෙලාගන්නා ලද කෘෂිකාර්මික නිෂ්පාදන මෙන්ම ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් විකුණනු ලබන අයිතමයන් අයත්වේ. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් සේ ආයතනය ඒවා වර්තමානයේ දී පාලනය කරනු ලබන විට හා එම අයිතමයන් සමඟ බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ව්‍යාපාරය තුළට ජනනයවීම භව්‍ය වන්නේ නම් හා ඒවායේ පිරිවැය හෝ සාධාරණ අගය විශ්වසනීය පරිදි මැනිය හැකිවන විට ජීව විද්‍යාත්මක වත්කම් ආයතනය විසින් හඳුනාගනී. දැව ලබාගැනීමට පාලනය කරන ගස් මුල්වරට හඳුනාගන්නා අතර, සෑම වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදීම ශ්‍රී.ල.ගි.ප්‍ර 41 ප්‍රකාරව ඒවා සාධාරණ අගයෙන් විකිණීම සඳහා යන පිරිවැය අඩු කළ පසු ලැබෙන අගයට නිරූපණය කෙරේ.

අපගේ ගණනය කිරීම්වලට අනුව තේක්ක ගසක පරිණත කාලය පැලය රෝපණය කළ දින සිට අවුරුදු 35 ක කාලයක් ගතවන බවත්, තේක්ක ගසක විද්‍යාත්මක පරිණාමය සිදුවන්නේ එහි ජීව කාලය අවුරුදු 10 ක් ඉක්මවා ගිය පසුවයි. ජීව විද්‍යාත්මක පරිණාමය සඳහා මෙම කාලච්ඡේදය තුළදී දැරීමට සිදුවන පිරිවැය ප්‍රමාණාත්මක නොවන හෙයින්, ළපටි වැවිලි වල පිරිවැය ඒවායේ සාධාරණ අගයට සමාන ලෙස සලකා ඇත.

#### 1.3.1.5 ආයෝජන

**1.3.1.5.1 ස්ථිර තැන්පතු ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.**

**1.3.1.5.2 දිගුකාලින ආයෝජන පිරිවැය මත සඳහන් කර ඇත.**

**1.3.1.5.3 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙහි ආයෝජන**

මෙම ආයෝජනයන් සිදුකර ඇත්තේ රාජ්‍ය දැව සංස්ථාවේ සේවකයින්ට නිවාස ණය පහසුකම් සැලසීම සඳහාය.

**1.3.1.5.4 අගය අඩුවීම ඇගයීම**

මූල්‍ය වත්කමක අගය අඩුවන බවට විෂය මූලික සාක්ෂි ඇතිදැයි එක් එක් වාර්තාකරණ දිනක දී ඇගයීමකට ලක්කිරීම සිදුකොට එසේ අගය අඩුවීමෙන් දැරීමට සිදුවන අලාභය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

**1.3.1.5.5 ලංකා ටිම්බර් ප්ලාන්ටේෂන් ඉන්ඩස්ට්‍රීස් සමාගමේ ආයෝජන**

මෙම ආයෝජනයෙන් කිසිඳු ලාභාංශයක් ලැබී නොමැත. තවද, ආයෝජනය කර ඇති රුපියල් මිලියන 30ක මුදල නැවත ලබාගැනීම ද අවිනිශ්චිතය. එමනිසා අගය අඩුවීමෙන් ලැබෙන අලාභය රු.30,000,000 ලෙස ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර ඇත.

#### 1.3.1.6 ජංගම වත්කම්

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස දක්වා ඇත්තේ මුදල් හා බැංකු ශේෂවලට අමතරව සාමාන්‍ය මෙහෙයුම් කාලය තුළ හෝ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වර්ෂයක් තුළ යන දෙකෙන් අඩු කාලයක් තුළ උපලබ්ධි වේයැයි අපේක්‍ෂා කරන වත්කම්ය.



#### 1.3.1.7 ණයගැතියෝ සහ අයවියයුතු දෑ

වෙළඳ ණයගැතියෝ සහ අනෙකුත් අයවියයුතු දෑ ඒවා උපලබ්ධිවීමට අපේක්ෂිත වටිනාකම් වලින් ප්‍රකාශ කරනු ලැබේ. බොල්ණය කපාහරිනු ලබන අතර ණයගැතියන්ගෙන් වියහැකි පාඩු ආවරණය සඳහා පහත සඳහන් පරිදි අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

| | |
|---|---|
| විශේෂ ප්‍රතිපාදන | :- අවුරුදු 5 ට වැඩි වෙළෙඳ ණයගැතියන් සඳහා 100% |
| සාමාන්‍ය ප්‍රතිපාදන | :- අවුරුදු 5 ට අඩු වෙළෙඳ ණයගැතියන් සඳහා 5% |

වසරකට වඩා වැඩි ගෙවීම් කාලයකින් යුත් කාර්ය මණ්ඩල ණයගැතියෝ සාධාරණ අගයට සඳහන් කරයි. එනම් එම කාර්ය මණ්ඩල ණයගැතියන්ගෙන් ලැබිය යුතු අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගයයි. ණය මුදල ලබාගන්නා දිනට මහ බැංකුවේ ප්‍රකාශයට පත්කරන ලද වාණිජ බැංකු ප්‍රමුඛ ණය දීමේ පොළී අනුපාත උපයෝගී කරගෙන එය ගණනය කරනු ලබයි.

#### 1.3.1.8 වෙළෙඳ තොග

වෙළෙඳ තොග අගයකරනු ලැබ ඇත්තේ පිරිවැය හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පරිත්‍යාග දැව තොග ද, අගය කොට ඇත්තේ පිරිවැය (තොග වර්තමාන ස්ථානයට සහ වර්තමාන තත්වයට ගෙනඒම සඳහා දරන ලද පිරිවැය) හෝ ඇස්තමේන්තුගත ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ය. පිරිවැය නිගමනය කරනු ලබන්නේ ප්‍රථමයෙන් ලැබීම්, ප්‍රථමයෙන් නිකුත් කරන පදනමට වන අතර පිරිවැයට, බඩුතොග ප්‍රවර්තන තත්වයට හා ස්ථානයට ගෙනඒමට දරන ලද සියලු වියදම් ඇතුලත්ය. නිෂ්පාදන සම්බන්ධයෙන් මේ වනවිටදී පිරිවැයට සියලු ඍජු වියදම් ද සාමාන්‍ය ක්‍රියාකාරී මට්ටම මත පදනම් වන නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ද ඇතුළත් ය. අවශ්‍ය අවස්ථාවන් හිදී යල්පැනගිය, සෙමින් අලෙවි වන හා දෝෂ සහිත බඩුතොග සඳහා ප්‍රතිපාදන සලසා ඇත. තොග හානිවීම් සඳහා 15% ක සාමාන්‍ය ප්‍රතිපාදනයක් සලසා ඇත.

### 1.3.2 වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ගැනෙනුයේ ඉල්ලූ වහා ගෙවිය යුතු ගෙවීම් හෝ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. ජංගම නොවන වගකීම් ලෙස ගැනෙනුයේ මූල්‍ය තත්ව ප්‍රකාශන දින සිට වසරකට වැඩිකාලයක් තුළ ගෙවිය යුතු ගෙවීම්ය. මූල්‍ය ප්‍රකාශනවල සියලුම හඳුනාගෙන ඇති වගකීම් ගිණුම්ගත කර ඇත.

#### 1.3.2.1 වෙළඳ හා අනෙකුත් කටයුතු සඳහා ගෙවීම්

වෙළඳ හා අනෙකුත් කටයුතු සඳහා ගෙවීම් අදාල පිරිවැය අනුව සඳහන් කර ඇත.

#### 1.3.2.2 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන විශ්‍රාම පාරිතෝෂික පනත අනුව අඛණ්ඩව වර්ෂ 05කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් විශ්‍රාම පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. කෙසේ වෙතත් සියලුම සංස්ථා සේවකයින් වෙනුවෙන් වර්ෂ 2014 දෙසැම්බර් 31 දිනට අවසන්කර ඇති සේවා කාලය හා අවසන්වරට ලැබූ වැටුප පදනම් කරගෙන සේවක විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත. අනාගතයෙහි ගෙවීමට සිදුවිය හැකි වගකීම් ගෙවීමේ පහසුව සඳහා මහජන බැංකුවේ ස්ථිර තැන්පතු ගිණුමක මුදල් ආයෝජනය කර ඇත.

#### 1.3.2.3 අසම්භාව්‍ය වගකීම්

මුදලින් මැනිය හැකි සියලුම වගකීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර, අනෙකුත් වගකීම් හෙළිදරව් කර ඇත.

ආනයනය කල ක්‍රියෝසෝට් තෙල්වල දෝෂ තත්වයක් සම්බන්ධයෙන් සැපයුම්කරු සමග මතභේදයක් ඇති අතර, එම මතභේදය හේතුවෙන් ඇ.ඩො 54,490.51 ක මුදලක් ණයවර ලිපියේ සඳහන් මුදලින් නිදහස් කර නැත. මෙම මතභේදය නිරවුල් වනතෙක් බැංකුව මගින් අදාල මුදල් රඳවාගෙන ඇත.

බගවන්තලාව වැපල්ටන් වාණිජ තුනී කිරීම් බිම් කට්ටියේ අනවසර හෙළීම් නිසා රජයට පාඩු සිදුවූ බවට දන්වන ලද අතර, පරීක්ෂණවලදී හෙළිදරව් වූ සමහර කරුණු හේතුවෙන් තවමත් නිශ්චිත නිගමනයකට එළඹිය නොහැකි බැවින් සංස්ථාවේ නිලධාරීන් සමග එක්ව එම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට වනසංරක්ෂණ ජෙනරාල්තුමා තීරණය කොට ඇත.

වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය දැව සංස්ථාවට එරෙහිව දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් උසාවියට රඹකැන්ඔය ජලාශයට යටවන භූමියේ දැව ඉවත් කිරීමේ දී සිදුවූ අක්‍රමිකතා හේතු කොට ගෙන බී වාර්තාවක් ඉදිරිපත් කරන ලද නමුත් සංස්ථාව විසින් නීතිපති දෙපාර්තමේන්තුවට තත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදී.  මේ වනතෙක් නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩුවක් ගොනුකර නොමැත.

### 1.3.3 විස්තීරණ ආදායම් ප්‍රකාශනය

විස්තීරණ ආදායම් ප්‍රකාශනය සකස්කර ඉදිරිපත් කිරීම සඳහා කාර්යයන්ට අනුව වියදම් වර්ගීකරණ ක්‍රමය භාවිතා කර ඇත.  එසේ කර ඇත්තේ එයින් සංස්ථාවේ කාර්යසාධනය ලෙස පිළිබිඹු වන බැවිනි. උපචිත පදනම අනුව ආදායම් හා වියදම් හඳුනාගෙන ඇත.

#### 1.3.3.1 ආදායම් හඳුනාගැනීම

දැව විකිණීමෙන් ලද ආදායම ගණනය කර ඇත්තේ දැව විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු මුදල, වෙළඳ වට්ටම් සහ ප්‍රමාණ සඳහා දෙනුලබන සහන ආදිය සැලකිල්ලට යොමුකිරීමෙන් සාධාරණ වටිනාකම් පදනමටය.  රාජ්‍ය දැව සංස්ථාවේ සහ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවකයින් හට 25% ක සහනදායී මිලක් යටතේ දැව නිකුත් කරන අතර, එම වියදම් සුහසාධක පහසුකම් වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කර ඇත.

#### 1.3.3.2 වියදම් හඳුනාගැනීම

වර්ෂය තුළ ලබා ඇති ලාභය ගණන් බැලීමේදී වසර තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් ආදායමෙන් අඩුකර ඇත.  අළුත්වැඩියා සහ නවීකරණයට අදාල වියදම් එය දැරූ වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයට හරකර ඇත.

##### 1.3.3.2.1 ආදායම් බදු

ප්‍රවර්තන හා විලම්භීත බදු වලින් ආදායම් බදු සමන්විත වේ.  ස්කන්ධයෙන් හෝ වෙනත් විස්තීරණ ආදායම් තුලින් ඍජුව හඳුනාගන්නා අයිතම වලට අදාල ප්‍රමාණය හැර ප්‍රවර්තන හා විලම්භීත බදු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශනය මගින් හඳුනාගනී.

වාර්තා කරන දිනට බලපවත්වන බදු අනුපාත හා පූර්ව වර්ෂය වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් උපයෝගී කරගෙන, වර්ෂයේ බදු ආදායම හෝ අලාභය මත ගෙවිය යුතු හෝ ලැබිය යුතු අපේක්ෂිත බදු මුදල ප්‍රවර්තන බදු ලෙස හඳුනා ගනී.
ආදායම් බදු අනුපාතය 28% වන අතර, කල්පිත ලාභාංශ බදු අනුපාතය 25% කි.

මූල්‍ය වාර්තාකරණය සඳහා වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ ශේෂය සහ බදු මුදල අතර තාවකාලික වෙනස ලබාගැනීම සඳහා වගකීම් ක්‍රමය භාවිතය මගින් විලම්භීත බදු මුදල ගණනය කෙරේ.  මූල්‍ය තත්වය ප්‍රකාශන දිනට බලපවත්වන බදු අනුපාත භාවිතයෙන් වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙන ආ නිරවුල් කළ යුතු ශේෂය හෝ අපේක්ෂිත උපලබ්ධි මුදල මත පදනම්ව විලම්භීත බදු මුදල ගණනය කෙරේ.

අනාගත වත්කම්වල පරිභෝජනයට ගතහැකි අගයට එරෙහිව අනාගතයේ දී බදු ලාභයක් ලැබීමේ සම්භාවිතාවයක් පවතී නම් එම ප්‍රමාණයට පමණක් විලම්භීත බදු වත්කම හඳුනාගැනේ.  වත්කමට අදාල බදු ප්‍රතිලාභය තවදුරටත් ලබාගත නොහැක්කේ නම් එම ප්‍රමාණයට විලම්භීත බදු වත්කම පහත හෙලනු ලැබේ.



##### 1.3.3.2.2 ස්කන්ධභාග ගෙවීම

2014 වසර සඳහා ස්කන්ධභාගය ගණනය කර ඇත්තේ හෙලා ඇති දැව පරිමාව අනුවය.

##### 1.3.3.2.3 පිරිවැය වෙන් කිරීම

දැව හුවමාරු අගය මත දැව පිරිවැය හා දැව ඉරුම්හල්වල පරිවර්තන පිරිවැය බෙදාවෙන් කරනු ලබන අතර, අදාල ඒකකය වෙත ප්‍රවාහනය කිරීමේ කුලී අගය මත යාන්ත්‍රික වැඩපොලේ පිරිවැය වෙන්කරනු ලබයි.

### 1.3.4 මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට පසුව සිදුවීම්

මූල්‍ය තත්ව ප්‍රකාශනය සකස් කළ දිනයට පසුව පැනනැගී සියලු සැලකිය යුතු සිද්ධීන් සැලකිල්ලට ගෙන, මූල්‍ය ප්‍රකාශවල අදාල සටහන් යටතේ නිසි ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

### 1.3.5 සේවක ණය චක්‍රීය අරමුදල

මෙම අරමුදල නිර්මාණය කොට ඇත්තේ සංස්ථාවේ සේවකයන්ට ණය ලබාදීමේ අරමුණිනි.  සේවක ණයපොලී ආදායම වෙනත් ආදායම් යටතේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි දක්වා, ආදායම් බදු අඩුකිරීමෙන් පසු ශුද්ධ පොලී ආදායම සේවක ණය චක්‍රීය අරමුදලට මාරු කරනු ලැබේ.

මෙමගින් සේවක ණය චක්‍රීය අරමුදල ගොඩනැංවෙන අතර, එමගින් ණය ලබාදීම අරමුදලේ ඇති මුදල් ප්‍රමාණයට සීමාවේ.

### 1.3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඍජු ක්‍රමයට අනුව පිළියෙල කර ඇත.  මුදල් සහ මුදල් වලට සමාන වත්කම්වලට වටිනාකම වෙනස්වීමේ අවධානමට යටත්ව ඉක්මණින් මුදල් වලට මාරුකර ගතහැකි ඉහළ ද්‍රවශීලීතාවයක් ඇති කෙටිකාලීන ආයෝජන ඇතුලත් වේ.  මුදල් සහ මුදල් සමාන වත්කම් වලට අතැති මුදල්, බැංකු ශේෂ සහ බැංකුවල ඇති කෙටිකාලීන තැන්පතු ඇතුළත් වේ.

# ගිණුම් සඳහා සටහන්

## 02. පිරිවැටුම

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| කදන් - රජයේ ඉඩම් වලින් ලද | 1,774,835,926 | 1,543,389,558 |
| කදන් - පුද්ගලික ඉඩම් වලින් ලද | 41,521,752 | 22,276,964 |
| ඉරුදැව | 156,140,096 | 170,298,367 |
| සිල්පර - පුද්ගලික ඉඩම් වලින් ලද | 324,619,571 | 218,085,380 |
| සිල්පර - රජයේ ඉඩම් වලින් ලද | 155,478,174 | 234,746,032 |
| සිල්පර - අපනයන | 48,297,160 | - |
| විදුලිකණු - රජයේ ඉඩම් වලින් ලද | 142,153,826 | 208,271,838 |
| විදුලිකණු - පුද්ගලික ඉඩම් වලින් ලද | 195,127,486 | 4,511,925 |
| අලි වැට කණු | 88,672,100 | 86,554,236 |
| වෙනත් | 24,737,684 | 24,707,962 |
| වනඅපරාධ දැව | 37,669,004 | 39,668,133 |
| රජයේ ඉඩම්වල පරිත්‍යාග දැව | 315,497,163 | 201,425,749 |
| ගෘහභාණ්ඩ | 238,318,417 | 198,529,090 |
| දළ පිරිවැටුම | 3,543,068,359 | 2,952ල465,235 |
| ජාතිය ගොඩනැගීමේ බදු | (69,220,911) | (58,716,558) |
| **එකතුව** | **3,473,847,448** | **2,893,748,677** |

## 03. විකුණුම් පිරිවැය

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| දැව ගබඩා හා මංසල ගබඩා | 906,772,371 | 723,341,531 |
| දැව පරිරක්ෂණාගාර | 661,198,073 | 604,406,762 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 165,251,217 | 146,648,802 |
| මංසල විකුණුම් | 287,174,876 | 221,736,385 |
| **එකතුව** | **2,020,396,537** | **1,696,133,479** |

## 04. විකුණුම් හා බෙදාහැරීමේ වියදම්

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| දැව ගබඩා | 505,088,613 | 447,078,988 |
| දැව පරිරක්ෂණාගාර | 7,209,147 | 9,821,782 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 27,587,476 | 17,327,761 |
| ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 11,883,430 | 9,145,006 |
| **එකතුව** | **551,768,665** | **483,373,537** |



## 05. පරිපාලන වියදම්

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| දැව පරිරක්ෂණාගාර | 38,127,030 | 22,184,888 |
| ගෘහභාණ්ඩ යන්ත්‍රාගාර | 29,144,333 | 24,573,880 |
| ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | 683,100,131 | 597,934,435 |
| සංචාර බංගලා | 6,723,210 | 7,107,478 |
| **එකතුව** | **757,094,704** | **651,800,681** |

## 06. වෙනත් ආදායම්

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| **6.1 මෙහෙයුම් නොවන ආදායම් සටහන 6.3** | | |
| පොළී ආදායම - ආයෝජන | 197,513,358 | 226,670,712 |
| විදේශ විනිමය හුවමාරු ලාභ/(අලාභ) | 1,136 | 4,723 |
| ගොඩනැගිලි කුලිය | 15,042,601 | 14,991,686 |
| පාරිතෝෂික අධි වෙන්කිරීම් | - | 6,198,327 |
| සේවක ණය පොළිය | 10,268,957 | 10,531,622 |
| | 222,826,051 | 258,397,070 |
| **6.2 මෙහෙයුම් ආදායම් සටහන 6.3** | | |
| විවිධ ආදායම් | 20,952,428 | 38,025,841 |
| දඩ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ | 568,079 | 543,947 |
| වත්කම් විකිණීමෙන් ලද ආදායම | 6,474,636 | - |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 27,245,757 | 10,046,557 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | 2,003,952 | 9,894,147 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | 1,153,737 | 1,000,453 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | 1,410,260 | 1,987,765 |
| | 59,808,848 | 61,498,711 |
| **එකතුව** | **282,634,899** | **319,895,781** |

## 6.3 වෙනත් ආදායම් විශ්ලේෂණය 2014

| ආදායම් මූලාශ්‍ර | අලෙවි ගබඩා | දැව පරීක්ෂණාගාර | ගෘහභාණ්ඩ නිෂ්පාදන ඒකක | සංචාරක බංගලා | ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යාලය | එකතුව |
|---|---|---|---|---|---|---|
| **මෙහෙයුම් නොවන ආදායම්** | | | | | | |
| පොළී ආදායම - ආයෝජන | - | - | - | - | 197,513,358 | 197,513,358 |
| විදේශ විනිමය හුවමාරු ලාභ/(අලාභ) | - | - | - | - | 1,136 | 1,136 |
| ගොඩනැගිලි කුලිය | - | - | - | - | 15,042,601 | 15,042,601 |
| පාරිතෝෂික අධි වෙන්කිරීම් | - | - | - | - | - | - |
| සේවක ණය පොළිය | - | - | - | - | 10,268,957 | 10,268,957 |
| | - | - | - | - | 222,826,051 | 222,826,051 |
| **මෙහෙයුම් ආදායම්** | | | | | | |
| විවිධ ආදායම් | 60,679 | - | - | 1,032,931 | 19,858,818 | 20,952,428 |
| දඬ - කොන්ත්‍රාත්කරුවන්ගේ සහ | - | - | - | - | 568,079 | 568,079 |
| සැපයුම්කරුවන්ගේ | - | - | - | - | 6,474,636 | 6,474,636 |
| වත්කම් විකිණීමෙන් ලද ආදායම | 18,191,286 | 8,991,622 | 62,849 | - | - | 27,245,757 |
| තොග හානි සඳහා අධි වෙන්කිරීම් | 1,873,827 | - | 130,125 | - | - | 2,003,952 |
| අඩමාන ණය අධි වෙන්කිරීම් | - | - | - | - | 1,153,737 | 1,153,737 |
| ඌණතා සහ පාඩු සඳහා අයකිරීම් | - | - | - | - | 1,410,260 | 1,410,260 |
| ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් | | | | | | |
| | 20,125,791 | 8,991,622 | 192,973 | 1,032,931 | 29,465,530 | 59,808,848 |
| **එකතුව** | 20,125,791 | 8,991,622 | 192,973 | 1,032,931 | 252,291,582 | 282,634,899 |



## 07 ආදායම් බදු

| | | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| ප්‍රවර්තන බදු වියදම් | සටහන 7.1 | | |
| ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බදු | | 202,347,540 | 131,882,763 |
| පෙර වර්ෂය සඳහා අධි/ඌණ වෙන්කිරීම් | | 2,237,777 | - |
| | | 204,585,317 | 131,882,763 |
| විලම්භිත බදු වියදම් | සටහන 7.2 | | |
| තාවකාලික වෙනස්වීම්වල ප්‍රවර්තනය හා මූලාරම්භය | | (8,360,739) | 18,339,939 |
| | | (8,360,739) | 18,339,939 |
| වර්ෂය සඳහා බදු අයකිරීම් | | 196,224,578 | 150,222,702 |

### 7.1 ප්‍රවර්තන වර්ෂයේ ලාභය සඳහා ආදායම් බදු

| | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| බදු පෙර ලාභය | 402,222,441 | 332,336,761 |
| සමාහාර ඉඩනොදෙන වියදම් | 293,664,679 | 103,786,686 |
| සමාහාර ඉඩදෙන වියදම් | (423,720,740) | (445,416,408) |
| ව්‍යාපාරික ලාභය | 272,166,380 | (9,292,961) |
| ව්‍යාපාරික නොවන ආදායම් | 212,557,094 | 241,667,122 |
| බදු අයකල හැකි ආදායම් | 484,723,474 | 232,374,161 |
| ආදායම් බද්දෙන් 28% | 135,722,573 | 65,064,764 |
| බෙදාහැරිය හැකි ලාභය මත ලාභාංශ බදු | 66,624,967 | 66,817,999 |
| **එකතුව** | **202,347,540** | **131,882,763** |

### 7.2 විලම්භිත බදු

| | තාවකාලික වෙනස රු. | බදු බලපෑම (වත්කම්/වගකීම්) රු. |
|---|---|---|
| 2014 ජනවාරි 01 වන දිනට ශේෂය | (119,274,300) | (33,396,805) |
| වසර තුල උත්පාදනය වූ මුදල | (29,859,781) | (8,360,739) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | (149,134,081) | (41,757,543) |
| දේපළ, පිරියත හා උපකරණවල තාවකාලික වෙනස | 286,797,062 | 80,303,177 |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදලේ තාවකාලික වෙනස | 435,931,143 | 122,060,720 |
| ඉදිරියට ගෙන ආ බදු අලාභය | - | - |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 149,134,081 | 41,757,543 |

## 08. දේපළ, පිරියත හා උපකරණ

| විස්තරය | පිරිවැය | | | | ක්ෂයවීම | | | | 2014.12.31 දිනට ඉදිරියට ගෙන එන ලද ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014.01.01 දිනට ශේෂය | එකතු කිරීම | ඉවත් කිරීම | 2014.12.31 දිනට ශේෂය | 2014.01.01 දිනට ශේෂය | ඉවත් කිරීම | වසර සඳහා අයකිරීම | 2014.12.31 දිනට ශේෂය | |
| ඉඩම් | 76,578,723 | 151,000 | - | 76,729,723 | - | - | - | - | 76,729,723 |
| ගොඩනැගිලි | 598,650,288 | 31,703,527 | - | 630,353,815 | 142,280,567 | - | 13,069,781 | 155,350,348 | 475,003,467 |
| දැව අට්ටිමඩු හා වෙනත් ගොඩනැගිලි | 19,256,777 | - | - | 19,256,777 | 17,316,104 | - | 921,514 | 18,237,618 | 1,019,159 |
| මාර්ග හා දුම්රිය මාර්ග | 16,598,376 | 81,000 | - | 16,679,376 | 4,989,039 | - | 793,684 | 5,782,723 | 10,896,653 |
| යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 625,899,259 | 22,868,809 | 9,215,299 | 639,552,770 | 461,553,537 | 9,215,279 | 26,628,107 | 478,966,365 | 160,586,405 |
| බදු අයිති ඉඩම් හා ගොඩනැගිලි | 148,311 | - | - | 148,311 | 148,311 | - | - | 148,311 | - |
| මාර්ග ඉදිකිරීම් යන්ත්‍ර හා උපකරණ | 60,450 | - | - | 60,450 | 60,450 | - | - | 60,450 | - |
| මෙවලම් හා උපකරණ | 5,148,263 | 496,965 | - | 5,645,229 | 4,725,977 | - | 153,170 | 4,879,147 | 766,082 |
| විදුලි උපකරණ | 13,453,576 | 1,547,389 | 20,260 | 14,980,705 | 7,297,534 | 20,245 | 909,405 | 8,186,694 | 6,794,011 |
| වාහන | 502,191,357 | 44,895,249 | 6,617,552 | 540,469,054 | 361,905,392 | 6,248,673 | 58,449,227 | 414,105,946 | 126,363,108 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 35,388,711 | 4,273,796 | 97,904 | 39,564,603 | 17,262,862 | 97,699 | 4,116,775 | 21,281,938 | 18,282,665 |
| කාර්යාලීය උපකරණ | 30,919,882 | 2,005,394 | 441,145 | 32,484,131 | 23,907,971 | 441,125 | 1,765,325 | 25,232,171 | 7,251,960 |
| පරිගණක හා උපාංග | 52,162,537 | 4,219,689 | - | 56,382,226 | 34,758,738 | - | 5,555,217 | 40,313,955 | 16,068,271 |
| විවිධ වත්කම් | 20,890,234 | 1,237,048 | 8,019 | 22,119,263 | 14,237,734 | 8,009 | 2,010,727 | 16,240,452 | 5,878,811 |
| පෙර නිමවුම් ව්‍යුහ | 4,938,333 | - | - | 4,938,333 | 4,938,333 | - | - | 4,938,333 | - |
| බදු අයිති ඉඩම් - රත්නපුර | 680,300 | - | - | 680,300 | 680,300 | - | - | 680,300 | - |
| එකතුව | 2,002,965,376 | 113,479,868 | 16,400,180 | 2,100,045,065 | 1,096,062,849 | 16,031,030 | 114,372,932 | 1,194,404,750 | 905,640,314 |

වාර්තා කරන දිනය වන විට පිරිවැය රු.890,095,837/-ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ ප්‍රමාණයක් සංස්ථාව සතුවේ.

## 09. අස්පෘශ්‍ය වත්කම්

| විස්තර | පිරිවැය | | | | ක්‍රමක්ෂය | | | | 2014.12.31 දිනට ඉදිරියට ගෙනඑන ලද ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014.01.01 දිනට ශේෂය | එකතු කිරීම | ඉවත් කිරීම | 2014.12.31 දිනට ශේෂය | 2014.01.01 දිනට ශේෂය | ඉවත් කිරීම | වසර සඳහා අයකිරීම | 2014.12.31 දිනට ශේෂය | |
| පරිගණක මෘදුකාංග | 3,011,537 | - | - | 3,011,537 | 774,395 | - | 602,307 | 1,376,702 | 1,634,835 |
| එකතුව | 3,011,537 | - | - | 3,011,537 | 774,395 | - | 602,307 | 1,376,702 | 1,634,835 |

## 10 ජීව විද්‍යාත්මක වත්කම්

සංස්ථාව සතු තේක්ක වගාවන් පිහිටි ස්ථාන පහත පරිදි වේ.

පුලියන්කුලම

මැදවච්චිය

සෙවනපිටිය

විනීතගම



## 11. ආයෝජන

### 11.1 ආයෝජන - දිගු කාලීන

| දෙසැම්බර් 31 දිනට | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| **ස්ථාවර තැන්පතුවල ආයෝජන** | | |
| මහජන බැංකුව | - | 117,100,000 |
| රාජ්‍ය ආයතනවල තාවකාලික අරමුදල් ගිණුම | 360,226,630 | 338,010,495 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 130,485,324 | 81,474,846 |
| | 490,711,954 | 536,585,340 |
| **කොටස්වල ආයෝජන** | | |
| ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය | 500,000 | 500,000 |
| සී/ස. ලංකා ටිම්බර් ප්ලාන්ටේෂන් සමාගම | 30,000,000 | 30,000,000 |
| (-) ආයෝජන අපහායනය | (30,000,000) | - |
| | 500,000 | 30,500,000 |
| **එකතුව** | **491,211,954** | **567,085,340** |

### 11.2 ආයෝජන - කෙටි කාලීන

| දෙසැම්බර් 31 දිනට | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| **ස්ථාවර තැන්පතුවල ආයෝජන** | | |
| මහජන බැංකුව | 696,410,412 | 694,408,552 |
| ලංකා බැංකුව | 877,910,713 | 509,082,847 |
| **එකතුව** | **1,574,321,125** | **1,203,491,399** |

## 12. තොග

| දෙසැම්බර් 31 දිනට | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| වෙළඳ බඩු තොගය | 919,995,872 | 899,863,184 |
| තොග හානිවීම් සඳහා වෙන්කිරීම් | (116,548,545) | (118,981,084) |
| | 803,447,327 | 780,882,100 |
| මාර්ගස්ථ තොග | 76,743,448 | 45,141,546 |
| කෙරීගෙන යනවැඩ | 36,902,197 | 21,137,014 |
| ගබඩා ද්‍රව්‍ය සහ අමතර කොටස් | 104,376,621 | 107,385,216 |
| පරිරක්ෂණය කිරීමේ ද්‍රව්‍ය | 27,987,940 | 20,049,766 |
| ඉන්ධන හා තෙල් | 2,590,469 | 2,903,761 |
| ලිපිද්‍රව්‍ය | 16,212,901 | 11,383,639 |
| **එකතුව** | **1,068,260,904** | **988,883,042** |

## 12.1 තොග විශ්ලේෂණය

| දෙසැම්බර් 31 දිනට | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ඳරජයේ ඉඩම් වලින් ලද කඳන් | 477,644,908 | 513,390,101 |
| රජයේ ඉඩම් වලින් ලද ඉරුදැව | 196,148,449 | 166,901,181 |
| පුද්ගලික ඉඩම් වලින් ලද කඳන් | 669,081 | 1,962,491 |
| රජයේ ඉඩම් වලින් ලද සිල්පර | 103,896 | 67,246,138 |
| පුද්ගලික ඉඩම් වලින් ලද සිල්පර | 1,377,702 | 22,816,418 |
| රජයේ ඉඩම් වලින් ලද විදුලිකණු | 49,274,718 | 11,341,942 |
| පුද්ගලික ඉඩම් වලින් ලද විදුලිකණු | 38,529,211 | - |
| වෙනත් | 13,242,339 | 9,548,955 |
| ගෘහභාණ්ඩ | 143,005,568 | 106,655,959 |
| **එකතුව** | **919,995,872** | **899,863,184** |

## 13. වෙළඳ හා වෙනත් ණයගැතියෝ

| දෙසැම්බර් 31 දිනට | | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | | 760,981,262 | 475,392,716 |
| අඩමාන ණය වෙන්කිරීම් | | (49,869,309) | (35,589,882) |
| | | 711,111,953 | 439,802,834 |
| කාර්යාල මණ්ඩල ණයගැතියෝ | සටහන 13.2 | 162,274,544 | 158,191,032 |
| වෙනත් ණයගැතියෝ | සටහන 13.1 | 17,898,395 | 19,995,516 |
| තැන්පත් සහ පූර්ව ගෙවීම් | | | |
| දේශීය මිලදීගැනීම් අත්තිකාරම් | | 38,659,265 | 16,332,025 |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් | | 29,189,005 | 24,903,941 |
| දැව සැපයීම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවූ අත්තිකාරම් | | 13,001,712 | 7,533,576 |
| තැන්පත් සඳහා ලැබිය යුතු පොළී | | 57,683,002 | 206,023,255 |
| ආපසු හරවා යැවූ චෙක්පත් | | 110,552 | 29,928 |
| කතරගම අෂ්ඨපල අරමුදල | | 1,000,000 | 1,037,000 |
| උසාවි තැන්පත් | | 8,752,033 | 8,752,032 |
| පරිසර අමාත්‍යංශය | | 3,817,263 | 6,886,714 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | | 6,910,741 | 322,398 |
| අයකර ගතහැකි එකතුකළ අගය මත බදු | | - | 293,689 |
| වරාය අධිකාරිය | | 563,698 | 604,095 |
| **එකතුව** | | **1,050,972,162** | **890,708,037** |



## 13.1 වෙනත් ණයගැතියෝ

| දෙසැම්බර් 31 දිනට | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| විවිධ ණයගැතියෝ | 3,828,645 | 4,861,555 |
| පොදු තැන්පත් | 14,433,370 | 15,480,581 |
| පොදු තැන්පත් සඳහා වෙන්කිරීම් | (366,620) | (366,620) |
| ටෙන්ඩර් තැන්පතු | 3,000 | 20,000 |
| **එකතුව** | **17,898,395** | **19,995,516** |

## 13.2 කාර්ය මණ්ඩල ණයගැතියෝ

| දෙසැම්බර් 31 දිනට ශේෂය | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණය | | |
| වාහන ණය | 3,899,083 | 4,681,265 |
| ආපදා ණය | 112,815,515 | 122,716,321 |
| විදුලි උපකරණ ණය | 50,067 | 156,973 |
| යතුරුපැදි ණය | 1,527,351 | 1,672,180 |
| ලැප්ටොප් පරිගණක ණය | 35,085,981 | 21,626,814 |
| ගෘහභාණ්ඩ ණය | 1,945,513 | 2,440,004 |
| | 155,323,510 | 153,293,558 |
| අත්තිකාරම් හා වෙනත් ණය | | |
| වැටුප් හා වේතන අත්තිකාරම් | 7,900 | 9,500 |
| ගමන් වියදම් අත්තිකාරම් | 45,687 | 70,945 |
| උත්සව අත්තිකාරම් | 4,239,279 | 2,183,467 |
| අභ්‍යන්තර හරපත් | 1,767,994 | 2,296,463 |
| සේවක අයකිරීම් | 790,174 | 215,879 |
| රෙදිපිළි ණය | 100,000 | 121,220 |
| | 6,951,034 | 4,897,474 |
| **එකතුව** | **162,274,544** | **158,191,032** |

## 14. මුදල් හා බැංකු ශේෂය

| දෙසැම්බර් 31 දිනට | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| අතැති මුදල් | 959,167 | 1,104,893 |
| මාර්ගස්ථ මුදල් | 7,914 | 15,027,593 |
| ලංකා බැංකුව ජංගම ගිණුම | 119,169,001 | 24,200,953 |
| ලංකා බැංකුව කාලීන තැන්පත් | 191,169,876 | 30,361,209 |
| **එකතුව** | **311,305,958** | **70,694,647** |

## 15. දායක ප්‍රාග්ධනය

| දෙසැම්බර් 31 දිනට | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ අරමුදල | 25,584,808 | 25,584,808 |
| වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පවරා ගත් වත්කම් | 10,714,815 | 10,714,815 |
| ලෝක බැංකු ආධාර | 708,202 | 708,202 |
| කැනේඩියානු හා බ්‍රිතාන්‍ය ආධාර | 4,495,843 | 4,495,843 |
| **එකතුව** | **41,503,668** | **41,503,668** |

## 16. සේවක ණය චක්‍රීය අරමුදල

| දෙසැම්බර් 31 දිනට | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| වසර මුල ශේෂය | 225,543,133 | 218,784,628 |
| සේවක ණය පොළී ලැබීම් | 5,102,915 | 7,582,768 |
| වසර තුල සිදුකරන ලද ගැලපුම් | (91,708) | (824,263) |
| වසර අග මුළු ශේෂය | 230,554,340 | 225,543,133 |
| දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට ගත් අරමුදලේ නාමික අගය | 196,135,203 | 200,043,003 |
| දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට නොගත් අරමුදල | 34,510,845 | 26,324,393 |

## 17. විශ්‍රාම පාරිතෝෂිකය

| දෙසැම්බර් 31 දිනට ශේෂය | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| වසර මුල ශේෂය | 340,599,947 | 367,895,815 |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන | 123,790,345 | 639,601 |
| වර්ෂය තුල ගෙවීම් | (28,459,149) | (27,935,469) |
| වසර අග ශේෂය | 435,931,143 | 340,599,947 |

විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන වගකීම් ගණනයේදී 1983 අංක 12 අරණ විශ්‍රාමික පාරිතෝෂික පනතට අනුකූලව අඛන්ඩව අවුරුදු 5ට වැඩි සේවාකාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. 2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ විශ්‍රාම පාරිතෝෂික සඳහා වන වගකීම ආයු ගණනය කිරීම යටතේ ඇගයීමට ලක් කරන ලදී.වාර්තා කරනු ලබන දිනට ප්‍රධාන උපකල්පන.

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| වට්ටම් අනුපාතය | 7.05% | 10.64% |
| අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය | 5.00% | 5.00% |
| සේවක පිරිවැටුම් අනුපාතය | 2.77% | 4.67% |
| විශ්‍රාම ගැන්වීමේ වයස (අවුරුදු) | 60 | 60 |



## 18. බදුකරණය

| දෙසැම්බර් 31 දිනට ශේෂය | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| වසර මුල ශේෂය | 88,581,787 | (29,473,329) |
| තැන්පතු මත රඳවාගැනීමේ බදු | (30,153,705) | (13,827,648) |
| වර්ෂය තුල ගෙවීම් | (30,819,565) | - |
| බදු සඳහා ඌණ වෙන්කිරීම් 2013 | 2,237,777 | - |
| වර්ෂය සඳහා වෙන්කිරීම් | 202,347,540 | 131,882,763 |
| වසර අග ශේෂය | 232,193,834 | 88,581,787 |

## 19. ණයහිමියෝ සහ උපචිත වියදම්

| දෙසැම්බර් 31 දිනට | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදල | 14,086,637 | 12,964,959 |
| සේවක භාරකාර අරමුදල | 1,698,070 | 1,555,815 |
| උපචිත වියදම් | 128,298,983 | 170,814,175 |
| ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 11,862,050 | 6,566,130 |
| ඇප තැන්පත් කාර්ය මණ්ඩලය හැර | 33,239,095 | 30,033,745 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 3,073,028 | 2,323,028 |
| ගනුදෙනුකරුවන්ගේ තැන්පත් | - | 10,400 |
| රඳවාගත් මුදල් | 13,969,943 | 10,118,269 |
| වෙනත් ණයහිමියෝ | 165,386,186 | 43,223,330 |
| ස්කන්ධභාගය - වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව | 964,283,581 | 661,562,629 |
| ස්කන්ධභාගය - වනජීවී දෙපාර්තමේන්තුව | 388,363 | 335,619 |
| එකතුකල අගය මත බදු | 23,510,868 | 22,168,086 |
| **එකතුව** | **1,359,796,803** | **961,676,185** |

# මූල්‍ය පාරිභාෂික ශබ්ද මාලාව

1 ගිණුම් ප්‍රතිපත්ති
මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී භාවිතා කරනු ලබන විශේෂ මූලධර්ම, පදනම්, සම්මත, නීතීන් සහ ක්‍රියාමාර්ග.

2 ක්‍රමක්ෂය
අස්පෘශ්‍ය වත්කම් එහි ඵලදායී ජීව කාලය තුල ක්‍රමවත් ලෙස බෙදා හැරීම.

3 උපචිත වියදම්
ආදායම් හා වියදම් ලැබීම් හෝ ගෙවීම් කාලපරිච්ඡේදයන් ගැන නොසලකා, එකිනෙක ගැලපීමේ මූලධර්මය.

4 මුදල් හා මුදල් වලට සමාන වත්කම්
මාස 3 ක් හෝ ඊට අඩු කාලයකින් කල්පිරෙන ද්‍රවශීලි ආයෝජන.

5 ආදායම් සංචිත
ආයෝජන සඳහා තබා ඇති සංචිත.

6 අගය එකතු කිරීම්
සංස්ථාව විසින් එහි ක්‍රියාකාරකම් මත උත්පාදනය කරන ලද ධන ප්‍රමාණය.

7 ක්‍රියාකාරී දර්ශකය
ජංගම වගකීම් වලින් ජංගම වත්කම් බෙදූ විට ලැබේ.

8 ක්ෂය වීම්
වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ඵලදායී ජීවකාලය තුල ක්‍රමවත්ව බෙදාහැරීම.

9 තෝලනය
යෙදවූ ප්‍රාග්ධනයට ණය ලබාගත් ප්‍රමාණය.

10 සාධාරණ අගය
දැනුමැති මනාප පාර්ශවයන් අතර අතේ දුරින් කරනු ලබන ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කලහැකි අගය වේ.

11 වත්කම් මත ඉපැයීම්
ශුද්ධ ආදායම මුළු වත්කමෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි. මෙය ලාභය මැනීමේ හා සමාන වෙනත් ආයතනවල කාර්යසාධනය සැසඳීමේ මිනුමක් ලෙස භාවිතාවේ.

12 විලම්භිත බදු
වර්තමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති, බදු ප්‍රතිපත්ති වලින් වෙනස් වීම නිසා අනාගතයේදී ඇති විය හැකි වත්කම් හෝ වගකීම් වේ.

